**අනුරාධපුර 04 වන සැසි වාරයේ 06 වන සභා වාරයේ සංක්ෂිප්ත වාර්තාව - 2018/09/04**

**සහභාගීත්වය -**

| | | | |
|---|---|---|---|
| 1. | එච්.පී. සෝමදාස මැතිතුමා | - | ගරු නගරාධිපති |
| 2. | එම්.ඩබ්. බුද්ධික ප්‍රේමදාස මැතිතුමා | - | ගරු නියෝජ්‍ය නගරාධිපති |
| 3. | ආනන්ද දහනායක මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 4. | ආර්.ඩී.කේ. සුසිල් තිලකරත්න මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 5. | ඒ.එම්.පී. අන්සාර් මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 6. | නලීන් සංජීව සිරිවර්ධන මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 7. | දුමිඳු දයාසෙන් රැටියල මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 8. | නීතිඥ රංජිත් රාජකාරුණා මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 9. | එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 10. | ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී. වීමුක්ති රණවීර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 11. | සුපිනි සඳමාලී මැතිනිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 12. | නාදීර ප්‍රභාත් ධර්මදාස මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 13. | එස්.ආර්.ඒ. සුරංගි රේණුකා සමරතුංග මැතිනිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 14. | එම්.ඩී.කේ. විනෝදනි විජේසූරිය මැතිනිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 15. | කේ.පී. සචිනි නිමේෂා මැතිනිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 16. | කේ.එච්. ඉන්දික අරුණ කුමාර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 17. | නීතිඥ ජේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 18. | ජේ.එම්. සමන් ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 19. | රශ්මික ගමආරච්චි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 20. | ඩී. ජී. පේමදාස මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 21. | ජී.ඒ. ශිවන්ත මලික් කුමාර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 22. | ආර්.ඒ. විමල් රවීන්ද්‍ර රණසිංහ මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 23. | නීතිඥ කේ.එස්.ටී. නිර්මලි ප්‍රියදර්ශනි මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 24. | කේ.ඒ. ඉන්ද්‍රානි මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 25. | ඩබ්.ජී.සී.කේ. ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 26. | එච්.බී. සීතා හේරත් මැතිනිය | - | ගරු නාගරික මන්ත්‍රී |
| 27. | එම්.එස්.එම්. අල් ෆාරීස් මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 28. | ඩබ්.එම්.එස්.එල්. විජේසිංහ මහතා | - | සභා ලේකම් |

**නොපැමිණීම -**

| | | | |
|---|---|---|---|
| 1. | රොෂාන් ඉස්මත් බුහාරි මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |
| 2. | ඊ.පී. අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී |

සභා ලේකම් ඩබ්.එම්.එස්.එල්. විජේසිංහ මහතාගේ ආරාධනාවෙන් අනතුරුව ගරු නගරාධිපති එච්.පී. සෝමදාස මැතිතුමා විසින් 04 වන සැසි වාරයේ 06 වන මහා සභා රැස්වීමේ කටයුතු 2018/09/04 වන දින පෙ.ව. 10.00 ට ආරම්භ කරන ලදී.

***01. 2018/08/10 වන දින පැවති මහා සභාවේ වාර්තාව සම්මත කර ගැනීම.***

නාගරික මන්ත්‍රී ගරු සුසිල් තිලකරත්න මැතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.පී.එම්. අන්සාර් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් 2018/08/10 වන දින පැවති මහා සභාවේ වාර්තාව සභා සම්මත විය.

**02. සභාවට ආමන්ත්‍රිත පෙත්සම් පැමිණි නිවේදන ඉදිරිපත් කිරීම.**

- ගරු නාගරික මන්ත්‍රී දුමිඳු දයාසෙන් රැටියල මැතිතුමා විසින් සහ ගරු නාගරික මන්ත්‍රී නීතීඥ ජේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා විසින් අනුරාධපුර, ගොඩගේ මාවත, අංක 189, එස්.ඒ. වික්‍රමසිංහ යන අය විසින් උසාවි පෙදෙස අංක 159 දරණ වෙළඳ ගොඩනැගිල්ල සින්නක්කරව ලබා දෙන ලෙස ඉල්ලා කරන ලද ඉල්ලීම සභා ගත කිරීම. ( ඇමුණුම - 01 )

**03. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ** - ඇත

***2018 සැප්තැම්බර් මස 04 මහා සභා රැස්වීම සඳහා ඉදිරිපත් කරන ප්‍රශ්න මාලාව.***

***අනුරාධපුර මහජන පොල භූමියේ ඉදිකර තිබු කඩ කාමර 16 සම්බන්ධව***

i. අනුරාධපුර මහජන පොල භූමියේ ඉදිකර තිබු කඩ කාමර 16 සඳහා අනුරාධපුර මහා නගර සභා සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා දී තිබුණේ ද ?
ii. ඉහත කඩ කාමර ඉදිකිරීමට මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරන ලද්දේ කුමන අමාත්‍යංශයකින් ද ?
iii. මෙම ව්‍යාපෘතිය සඳහා මහා නගර සභා අරමුදල් කොපමණ ප්‍රමාණයක් වැය කර තිබේ ද ?
iv. කඩ කාමර ඉදි කිරිමට වැය වු සම්පූර්ණ මුදල කොපමණ ද ?
v. මෙම කඩ කාමර ඉවත් කිරිම සඳහා අනුමැතිය මහා නගර සභාවේ මහා සභා අනුමැතිය ලබා දී තිබුණා ද ?
vi. මෙම කඩ කාමර ඉවත් කිරීමේ වගකීම කවුරුන් විසින් භාර ගන්නේ ද ?

ඉහත ප්‍රශ්ණ සඳහා පිළිතුරු ගරු නගරාධිපතිතුමා විසින් සභාගත කරන ලදී. ( ඇමුණුම අංක - 02 )

**04. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

***4.1 ගරු නගරාධිපතිතුමා විසින් කරනු ලබන යෝජනාව.***

***2019 වර්ෂයට ළමුන් ඇතුලත් කිරිමේ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරිම සම්බන්ධව නිවැරදි කිරිම සඳහා සභාවේ එකඟතාවය ලබා ගැනීම සඳහා කරනු ලබන යෝජනාව***

මහා නගර සභා ආඥා පනතේ 1987 අංක 19/2 (ඞඞඞ) ( ii ) මහා නගර සභා ප්‍රදේශය ඇතුළත වූ පාසැල් විවෘත කිරිම, වසා දැමීම, ඒකාබද්ධ කිරිම, නම් කිරිම හා උසස් කිරිම සම්බන්ධයෙන් උචිත බලධරයාට

නිර්දේශ කිරීම යන වගන්ති ප්‍රකාරව වර්ග කිලෝ මීටර් 37 ක ප්‍රමාණයක විහි දී ඇති අනුරාධපුර නගර සීමාව තුල පදිංචි වී සිටින දරුවන් එකී ප්‍රමාණය තුල පිහිටි පාසලකට ඇතුලත් කිරීමේ අයිතිය උල්ලංගනය

වන ලෙස නිකුත් කර ඇති චක්‍ර ලේඛ අංක 24/2018 අනුව දරුවන් සඳහා අධ්‍යාපන අවස්ථා අහිමිවීම සම්බන්ධව දෙමාපියන් විසින් මා වෙත අදාල පාර්ශවයන් දැනුවත් කරන මෙන් ඉල්ලීමක් කර ඇත.

අදාල පාසැල් පහත පරිදි වේ.

01. අනුරාධපුර ඩී.එස්. සේනානායක ආදර්ශ ප්‍රථමික විද්‍යාලය

02. අනුරාධපුර මහින්ද ආදර්ශ ප්‍රථමික විද්‍යාලය

එකී ඉල්ලීම් අනුව මේ සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමන්, අධ්‍යාපන අමාත්‍යංශ ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දැනුවත් කර මේ සඳහා විසඳුම් ලබා ගැනීමට එකඟතාවය සහ ගරු සභාවේ නිර්දේශ ලබා ගැනීමට කරනු ලබන යෝජනාව.

- ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව **ඒකච්ඡන්දයෙන් සභා සම්මත විය.**

## ගරු නාගරික මන්ත්‍රී එම්.ඩී.කේ. විනෝදනි විජේසූරිය මැතිතුමිය.

නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵල භුක්ති විඳින පිරිසක් සිටින අප මහා නගර සභාවේ තීන්තු තීරණ ගන්නා නගරයේ ප්‍රධාන ආදර්ශ ප්‍රාථමික පාසැල් දෙකෙහි පළමු ශ්‍රේණියේ පන්ති රැක ගැනීමට ගෙන ආ මෙම යෝජනාවට අවස්ථාව දීම පිළිබඳව සියලු දෙමව්පියන් වෙනුවෙන් ගෞරව ස්තූතිය පුද කරමි.

එදා දිවංගත රජරට අසහාය නායක බර්ටි ප්‍රේමලාල් දිසානායක මැතිතුමන් පළාත් ප්‍රධාන අමාත්‍යවරයා මෙන්ම විෂය භාර අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස උතුරු මැද පළාතේ දරුවන්ට " අධ්‍යාපනයන් තොර අනාගතයක් නොමැත " යන දැක්ම තුල ඇති කළ නගරයේ ප්‍රධාන ආදර්ශ ප්‍රාථමික පාසල් දෙකක් වන ඩී.එස්. සේනානායක විද්‍යාලය හා මහින්ද ආදර්ශ ප්‍රාථමික විද්‍යාලය බිහි වනුයේ අප දෙමාපියන් ගේ සිහිනයක් වූ තමාට ලබා කර ගත නොහැකි වූ ඉලක්කය කරා ගුණාත්මක අධ්‍යාපනය තුළින් ගෙන යාමේ සිහිනය සැබෑ කරවමිණි.

එහෙත් අධ්‍යාපන අමාත්‍යංශය විසින් 2018.05.31 24/2018 නිකුත් කර ඇති චක්‍ර ලේඛයට අනුව ගත් නිර්ණායක තුල එම චක්‍ර ලේඛයේ සඳහන් පන්තියක ළමයින් 35 ක් යන සංඛ්‍යාව තීරණය වීම දරුවන්ගේ වර්ධනයට ගත් සුභ පෙර නිමිත්තකි. එහෙත්, 2017.10.30 කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමන්ගේ අත්සනින් යුතුව නිකුත් කළ මාගේ අංක උමැප/අනු/කලාප/සං/01 ශ්‍රේණිය සිසුන් ඇතුලත් කිරීම සම්බන්ධව ලිපියට අනුව 2019 වසරට පන්ති 08 ක් දක්වා අඩුවීමක් සිදු කිරීම සිදුවනු ඇත.

ඉහත 24/2018 චක්‍ර ලේඛයේ පන්තියක සිටිය යුතු ළමුන් ප්‍රමාණය මිස පන්ති ප්‍රමාණයක් සඳහන් නැත. එහෙත්, මා සඳහන් කරන 2017.10.30 ලිපියෙහි සීමා තුළ පන්ති ප්‍රමාණය සීමා වීම සිදු වී ඇත්තේ අප පළාත තුළ පමණි. එහි දී මෙවර දරුවන් ඇතුළත් කිරීමේ දී පෝෂිත ප්‍රදේශයෙන් පිටත යන කරුණ සැලකිල්ලට ගෙන සම්පුඛ පරීක්ෂණයට ඉදිරිපත් වුව ද ඉහත සීමා තුළ එම විද්‍යාලයක 2019 වසරට පළමු පන්තියට ඇතුළත් කරගත හැක්කේ දරුවන් 296 ක් පමණි. ඉන් ද දරුවන් 40 ක් ක්‍රියාන්විත සේවයේ රණවිරු පවුල් සඳහා වෙන් වේ. එය නගරයේ ම දරුවන් යැයි හෝ පෝෂිත ප්‍රදේශයේ දරුවන් නොවේ. ඒ තුළ 256 කට පමණක් අවස්ථාව ලැබේ. මෙවන් තත්ත්වයක් තුළ පසුගිය වසරේ එම විද්‍යාල වල එක් පන්තිය බැගින් ඉවත් කර ඇත. මේ පිළිබඳ හඬක් නැගීමට විෂය භාර පළාත් අධ්‍යාපන අමාත්‍යවරයකු හෝ මෙවන් සභාවන් තුළ මහජන නියෝජිතයන් නොවීම වැනි තත්ත්වයන් තුළය. එම නිසා අප මහා නගර සභාවේ ආඥා පනතේ වගන්ති ප්‍රකාරව පාසැල් උසස් කිරීම සම්බන්ධයෙන් උචිත බලධාරියාට නිර්දේශ ඉදිරිපත් කිරීම යටතේ මා සඳහන් කළ සීමා ඉවත් කර දරුවන් 35 බැගින් වූ පන්ති කාමර දෙකක් හෝ යොදවා මෙතෙක් පහසුකම් සහිතව පැවති පන්ති කාමර 10 පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් පක්ෂ පාට භේදයකින් තොරව සහයෝගය ලබා දෙතැයි ඉල්ලා සිටිමි.

## ගරු නාගරික මන්ත්‍රී නදීර ප්‍රභාත් ධර්මදාස මැතිතුමා.

ගරු නගරාධිපතිතුමනි, අපි ඉස්සල්ලාම න්‍යාය පත්‍රය දීලා තියෙන කාරණය වුට්ටක් සංශෝධනය කරන්න ඕනේ. මොකද අපට චක්‍රලේඛ වලට අභියෝග කරන්න හැකියාවක් නැහැ. ඒ නිසා මේක උතුරු මැද පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩල තීරණය වෙනස් කිරීම ලෙස සඳහන් කර, ආණ්ඩුකාරතුමාට යවන්න ඕනේ. මොකද මේ 24/2018 චක්‍රලේඛයේ පන්ති අටක් කරන්න කියලා කොහොවත් සඳහන් කරල නෑ. තියෙන පන්තියක දරුවන් 35 දක්වා පවත්වාගෙන යා යුතුයි කියන එක තමයි තියෙන්නේ. ඒක හොඳයි, මොකද පන්තියක පවත්වාගෙන යා යුතු මට්ටම ඒකයි. මෙතන තියන ප්‍රශ්නේ තමයි උදාහරණයකට ගත්තොත් ගිය වර්ෂයේ දී පන්ති 08 ක් බවට පත් කරලා තියනවා, මේ වර්ෂයේ දී පන්ති 09 ක් බවට පත් කරලා තියනවා. එතකොට ගරු නගරාධිපති කලාප අධ්‍යාපන කාර්යාලයට ප්‍රධාන අමාත්‍යාංශය ලිපියක් නිකුත් කරලා තියෙනවා පාසල් වලට විදුහලක පෝෂක ප්‍රදේශයේ සිටින සියලුම දරුවන් මීට ඇතුළත් කරගත යුතුයි කියලා. ඉන් අනතුරුව තමයි අනෙකුත් පදනම් වලට ආදි ශිෂ්‍ය පදනම කියන පදනමකින් හෝ රණවිරු පදනම, ඒ වගේ දේවල් වලින් ගන්න කියලා තියෙන්නේ.

නමුත් දැන් 2018 වර්ෂයේ ඉල්ලුම්පත්‍ර ලැබිලා තියෙනවා නගරාධිපතිතුමා ආසන්න වශයෙන් ළමයි තුන්සියයකට එක් පාසලකට. එතකොට මේ අනුව සියලුම දරුවන් ගන්න වෙන්නේ නෑ. මොකද 37 ගානේ පංතිය 8 කට ගත්තොත් 296 ගන්න පුළුවන් වෙන්නේ. එතකොට ආසන්න ප්‍රදේශ වල ළමයි වත් ගන්න බැහැ. එතකොට ආදිශිෂ්‍ය පදනම මත, ස්ථාන මාරුවීම් පදනමක් මත, ක්‍රියාන්විත සේවා හෝ මේ කිසිම කෙනෙකුට අවස්ථාව ලැබෙන්නේ නෑ. ඉතිං ඒ හින්දා අපි මේක කරන්න ඕනෙ අධ්‍යාපන අමාත්‍යවරයා පහුගිය හිටපු පේෂල ජයවර්ධන ඇමතිවරයා යවා තියෙනවා ගරු නගරාධිපතිතුමා ලිපියක්. ඒකේ සඳහන් කරලා තියෙනවා අමාත්‍ය මණ්ඩල තීරණයක් අරගෙන එක් පාසලකට පළමු ශ්‍රේණියට පන්ති 08 ක් විය යුතුයි කියලා. ඊට ක්‍රියාත්ම වීම 2018 වර්ෂයේ සිට පියවර ගත යුතුයි යන්න සඳහන් කරලා තියෙනවා. ඉතින් මම කියන්නේ අපි නිර්දේශය යවන්න ඕන අපේ මේ මහ නගර සභාවේ බලතල අනුව මහා නගර සභා ආඥා පනත අනුව. එ්ක අපි කිව්වොත් නගරාධිපතිතුමනි මේ පාසල්වල උසස් කිරීම් සම්බන්ධව නිර්දේශ යවන්න ඕන ගරු ආණ්ඩුකාරතුමා වෙත.

අපි මේ චක්‍රලේඛය සමඟ ගැටෙනවා නෙවෙයි. මේ අමාත්‍ය මණ්ඩල තීරණය වෙනස් කරලා ඒ පන්ති 8 නැවත 10 දක්වා වැඩිකර ලෙස ඉල්ලීමක් කිරීමයි කරන්න ඕනේ. දැන් මං බලන්න ගියාම ඩී එස් සේනානායක විද්‍යාලය හා මහින්ද විද්‍යාලයේ වහලා තිවනවා පන්ති. ඒ පන්ති වල සියලුම පහසුකම් තියනවා. මේක මේ ජනගහණය වැඩි උනේ, අපි ඉස්සර පර්චස් 40 ගානෙ තමයි ඉඩම බෙදන්නේ. ඒක දැන් පර්චස් 5 - 8 ක් වගේ කැඩුනනේ. ඊට පස්සේ පර්චස් 40 ක පවුල් 5කට යනවා. අද වෙනකොට ජනගහනය වැඩි වෙලා. ඉතිං මේත් එක්ක ආසන්න ප්‍රදේශවල ඉන්න දරුවන්ටත් ඒ අවස්ථාව ලැබෙන්නේ නෑ. ඒ අනුව න්‍යාව පත්‍රෙය් ඇති යෝජනාව සංශෝධනය කරමින් අදාල ඉල්ලීම ක්‍රියාත්මක කිරිමට අප සියලු දෙනාගේම සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලීමක් කරනවා.

### ගරු නාගරික මන්ත්‍රී සමන් ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා.

ගරු නගරාධිපතිතුමානි, මේ කාරණාව සම්බන්ධයෙන් අපේ කිසිම විවාදයක් නෑ . අපි මේකට එකඟයි. ඒ උනාට මේ පන්ති දෙක වැඩි කරා කියලා මේ කියන ප්‍රශ්නය හා ඊට මේ ප්‍රතිඵල ලැබෙනවා ද ? ඔය පාසල් සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන්න ඔනේ. පාසල් සඳහා දරුවන් ඇතුලත් කරන්න දෙමව්පියන් පොර කනවා. ඔය පාසල් වල තියෙන පහසුකම් වගේ අනිත් පාසැල් වලට සමව සම්පත් ලබා දෙන්නත් ඒවා දියුණු කරන්නත් කටයුතු කළා නම් මේ වගේ තදබදයක් ඇති වෙන්නෙ නෑ. ඒ නිසා එම කාරණාව සම්බන්ධයෙන් ......... අනිත්, ප්‍රාථමික පාසල් වලත් මේ වගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කරන්න කටයුතු කරන්න කියලා සහ ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. එමගින් සහනයක් ලැබෙයි. නමුත් මේ අනිකුත් පාසල්වල අවශ්‍යතා වැඩි දියුණු කළොත් ඊට වඩා සහනයක් ලැබෙයි කියල මම මේ අවස්ථාවේදී සභාවට ප්‍රකාශ කර සිටිනවා.

### ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා.

ගරු නගරාධිපතිතුමනි, මෙතනින් ඔබතුමා බලාපොරොත්තු වන කරුණ මොකක්ද කියන එක මට පැහැදිලි නෑ. කෙසේ වුවත් දෙමව්පියන් මුහුණ දෙන බරපතළ ගැටලුවක් තමයි සමහර ප්‍රාථමික විද්‍යාල හා මහා නගර සභා සීමාව තුළ තියෙන පාසල් වලට ඉල්ලුම් කරහම පදිංචිය නගර සීමාවේ කියලා තහවුරු ව පිළිබඳ ගැටලුවත් තියෙන දේ. භූගෝලය පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා. පදිංචිය තහවුරු නෑ මහා නගර සභා සීමාවට. නමුත් ඡන්දදායකය තිවනවා නගර සීමාව තුළ. එහි දී දරුවාගේ අයදුම්පත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වෙන අවස්ථාවක් නෑ. විදුහල්පතිවරයා තීරණය කරනවා මේක නගර සීමාවේ පාසලක් නෙවෙයි කියලා. අන්න එතකොට ළඟම පාසල හොඳම පාසල කියන.... ඩී.එස්. සේනානායක ප්‍රාථමික විද්‍යාලයට පුබුදුපුර මායිමේ ඉන්න දරුවෙකුට ඇතුලත් කර ගන්න ඔබතුමාගෙන් ලියුමක් ලබා ගන්න සිදු වෙනවා. දැන් මෙතැන මේ ගැටලුව ඇවිල්ලා තියෙන්නෙ මායිමේ

තියෙන පාසල් කීපයකට. ඒ නිසා අන්න ඒ සම්බන්ධව මේ භූගෝලීය සාධක පිළිබඳව විදුහල්පතිවරුන් දැනුවත් කරලා කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

<u>ගරු නාගරික මන්ත්‍රී නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා.</u>

ගරු නගරාධිපතිතුමනි, මගෙත් අදහසක් තියෙනවා. කරුණු කීපයක් මේකේ ගැබ් වුණා. මට මතකයි ඔය විද්‍යාලය හදන්න ප්‍රධාන වශයෙන්ම මැදිහත් වුනේ ඇමතිතුමාත් එක්ක මම, ඒ වෙලාවේ ආපු උද්ඝෝෂණ අනුව බලන කොට එතුමා පිටරට. එවෙලාවේ මහ විශාල ජනකායක් ඇවිදින් කිව්වා වලිසිංහ හරිස්චන්ද්‍ර විද්යාලය නැති කරන්න යනවා කියලා. අන්තිමේදී මම කරපු දේ අවසානයේ ළමයි ඉන්න අය එන්නකෝ කියලා වෙනම අරගත්තා. එතන හිටිය තිස්ස අටදෙනයි. පළවෙනියටම හිටියේ බුලන්කුලම කෙනෙක්. නමුත් මං එවෙලෙම ලියුමක් දුන්න 38 දෙනාම ඇතුල් කරගන්න..

දැන් මේ විද්‍යාල ප්‍රශ්නය, මේ නවීකරණය කරලා ඒකාබද්ධ පාසල් ක්‍රමය ඇති කලේ මෙහෙ තමයි ලංකාවෙ හැම පළාතකම මේ වගේ එකක් තිබුනා. දැන් අර තරගය ඇතුලේ ඉස්සර ඩී එස් සේනානායක ඉස්කෝලේ දිහා බැලුවෙත් නෑ මහින්ද ඉස්කෝලේ දිහා බැලුවෙත් නෑ. ඔය හැදුවට පස්සේ තමයි ඒ කට්ටිය ඉල්ලුම්පත්‍ර දාන්නෙ, තරගය තියෙන්නේ . මෙන්න මේ තරඟය උඩ දැන් අර ඕකට විසඳුමක් වශයෙන් පෝෂිත ප්‍රදේශයේ තවත් පාසල් සමාන කරලා තියෙනවා මහා බෝධි විද්‍යාලය උනත් 1 - 5 පන්ති තමා දැන් යන්නේ. ඉන් පස්සෙ වලිසිංහ හරිස්චන්ද්‍ර විද්දාාලයට තමා යොමු වෙන්නේ. දැන් වෙලා තියෙන්නේ මෙන්න මේ වගේ ඉස්කෝල වල ඉන්න ගුරුවරු අර පොඩ්ඩක් ප්‍රයිවට් ක්ලාස් කරනවා , ශිෂ්‍යත්ව පන්ති කරනවා, ඒ අතරේ පොඩි ජනප්‍රියකමක් තියෙනවා. මහා බෝධිය ඉස්කෝලේ ඉන්න ගුරුවරු අනිත් ඉස්කෝල වල ඉන්න අයත් එකම කට්ටිය ඉන්නේ. උපාධිධාරී ගුරුවරු ඉන්නවා science ගුරුවරු ඉන්නවා. හැබැයි මොන කරුමයද දන්නේ නෑ මහජනයාගේ මතයක් තියෙනවා ඒ ඉස්කෝලෙ හොඳ නෑ කියන එක. ඒක එකක්.

ඊළඟට දෙවැනි කාරනේ තමයි, මානසික තත්වයන් තියෙනවා. ඩී එස් සේනානායක විද්‍යාලයට දාන්න හදලා තියන ප්‍රතිපත්ති තීරණයක් ඒ ප්‍රතිපත්ති තීරණය නිලධාරින් දන්නෙ නෑ . මොකක්ද මේ ප්‍රතිපත්ති තීරණය, වලිසිංහ හරිස්චන්ද්‍ර විද්දාාලයේ පෝෂක ප්‍රදේශයයි ඩී.එස්. සේනානායක විද්‍යාලයේ පෝෂිත ප්‍රදේශයයි එකක් වශයෙන් සලකන්න කියලා ඒක තියෙන්නේ. අනිත් තීරණය තමයි මහින්ද විද්‍යාලයේ පෝෂක ප්‍රදේශයයි නිවත්තකචේතිය විද්‍යාලයේ ප්‍රදේශයයි එකක් ලෙස සලකන්න කියලා. මේ එක දන්නෙ නෑ නේ. මේක ප්‍රායෝගික ප්‍රශ්නයක්. ඉතිං ඒ නිසා එහෙම වෙලා තියෙද්දි මේ අභිංසක ළමයි මිහිඳුපුර ළමයි ගන්න බැහැ කිව්වනේ. අනිත් එක අනාථ නිවාසවල ළමයි මිහිඳුපුර කියන්නේ වලිසිංහ හරිස්චන්ද්‍ර විද්‍යාලයේ පෝෂක ප්‍රදේශය.. අනිත් එක මේ ඉස්කෝල පෙනෙන්න ඉන්න ළමයි ටික. මේක අධ්‍යාපන කලාපයක තියෙන්නෙ. මේක education zone 1 . ළඟම ඉන්න අර ළමයි වෙනුවෙන් අපට වෙනම කටයුතු කරන්න ඕනේ වුණා. විශේෂයෙන්ම බාලිකා විද්‍යාලය ගන්නේ නෑ ළමයි අනාථ ළමයි කියලා. ඒවා ගැන අපි කතා කරන්න ඕනේ ඒවාතමයි ඒවා විසඳෙන්නේ ඕනේ මේ චක්‍රලේඛ අනුව නෙමෙයි.

අපේ නගරයේ දරුවන්ට මේ අවශ්‍යතාවයන් තියෙන්න ඕනෙ. මට මතකයි 1990 සිට මේ සභාවේ පූර්වගාමී මන්ත්‍රීවරයකු ලෙස. ලංකාවේ ජාතික පාසල් හැමතැනම හැදුවා බදුල්ලේ විජයමුනි ලොකුබණ්ඩාර ඇමතිතුමා පාසැල් 35 ක් ජාතික පාසල් කරා. මේ නගරයේ මම තමයි යෝජනාව ගෙනාවේ මේ සභාවට අනුරාධපුර බලිකා විද්‍යාලය, මධ්‍ය මහා විද්‍යාලය ජාතික පාසල් බවට පත්කරන්න කියලා. ඒ මම යෝජනාව ගෙනල්ලා සම්මත කරලා යැව්වට පසු තමා මේ පාසල් ජාතික පාසල් බවට පත් කරන්න කටයුතු කළේ. ඒ නිසා අපිට පාසැල් ගැන කතා කරන්න අයිතියක් තියෙනවා. හැබැයි මේකේ තියෙන විෂයපථය සම්බන්ධයෙනුත් මේවා ආණ්ඩුකාරතුමාට ලියලා මේ ප්‍රතිපත්ති තීරණ කඩිනමින් වෙනස් කරන්නේ නෑ. අපිට මේ මුලින්ම පාසල් තිබුන විදිහ මතක් කරල දෙන්න නං. හරි මෙන්න මේ ආකාරයටයි ඉස්කෝලෙ තිබුනෙ කියල ඉතින් ඒ නිසා මහජනතාව වෙනුවෙන් ගත්ත මේ ඉල්ලීම හොඳයි.

<u>ගරු නගරාධිපතිතුමා</u>

නගරයේ ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් ප්‍රමුඛතාවය දෙන්න ඕන.

<u>ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා.</u>

ගරු නගරාධිපතිතුමා ඔබතුමා ගෙනාපු යෝජනාව මම ප්‍රථමයෙන් ම කාලෝචිත යෝජනාවක් කියලා ප්‍රකාශ කරනවා. ඒකෙ පැහැදිලිවම කියනවනනම් ගරු නගරාධිපති තුමනි සහෝදර පදනම මතට ප්‍රමුඛත්වය දීලා දැම්මේ. චක්‍රලේඛ අනුව එහෙම වෙන්නෙත් නෑ කියලා. ඒවගේම රණවිරු පදනම, ආදිශිෂ්‍ය පදනම, සහෝදර පදනම ඔය වගේ. දැන් මේකෙ තියෙනවා ඔබතුමා

කියන විදියට දැන් මේ කහටගස්දිගිලිය හොරෝපතාන යන ප්‍රදේශවලත් පළවෙනි වසරට ඇතුල් කරගන්න නෑ. මේ වෙනකොට මම දන්න තරමින් නම් විශේෂයෙන් කියන්න ඕන දැන් නගරාධිපතිතුමනි, පෝෂිත කලාපයේ අක්කා ඉස්කෝලෙ යනවා වලිසිංහයට, ඩී එස් සේනානායක විද්‍යාලයේ ඉඳලා ශිෂ්‍යත්වෙන් පස්සේ. නංගිව දාගන්න බැරුව ඉන්නවා. මොකද ඒකේ තියෙනවා පදිංචිය දුම්රිය නිවාස කියලා. ඉතිං ඇත්තටම පෝෂක කලාපය තුළ යන්න වෙන පාසලකුත් නැහැ. මේක සමස්ත වශයෙන් එකට ගන්නවට වඩා මේ ලඟම ඉන්න අය ඉස්කෝලෙට කිලෝමීටර භාගයක් වත් නැහැ. එහෙම අයවත් ගන්නෙ නෑ කියලා තමයි තියෙන්නේ. සම්මුඛ පරීක්ෂණයේ ආදිශිෂ්‍ය කොටසකුත් ඉන්නවා. මන්ත්‍රීවරුත් ඉන්නවා ඇත්තටම කොයි විදිහට තෝර ගත්තද කියන එක මට නම් තේරෙන්නෙ නෑ. ඉතින් ඔබතුමා හරි මැදිහත් වෙලා මේ තියෙන අඩුපාඩු සඳහා අවධානය යොමු කරලා ඉදිරි වර්ෂය ට දරුවන් ඇතුලත් කර ගැනීමේදී සාධාරණයක් ඉටු කරන්න කටයුතු කරන ලෙස මා ඉල්ලීමක් කරනවා.

<u>ගරු නගරාධිපතිතුමා.</u>

මෙතන දී හොඳම දේ තමයි පෝෂක පෙදෙස ඉන්න දරුවන් අරන් නෑ. නමුත් හොරොව්පතාන දරුවන් අරන් තියෙනවා. ඒක මම දන්න කරුණක් . මේ මෙන්න මේ විදියට සිද්ධ වෙන්න හොඳ නෑ. මේ සම්බන්ධයෙන් අපි මේ නිලධාරීන් දැනුවත් කළ යුතුයි. චක්‍ර ලේඛයටත් වැඩිය මේක ක්‍රියාත්මක කිරීමේදී නිලධාරීන් දැනුවත් විය යුතුයි. ඒ නිසා අපි කියන්නේ අපේ ඉල්ලීම මේක ඔබතුමාලා එක ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න කියලා.

<u>ගරු නාගරික මන්ත්‍රී එච්.බී. සීතා හේරත් මැතිතුමිය</u>

ගරු නගරාධිපතිතුමනි, මේ වෙලාවේ මේ ප්‍රශ්නය ගැන මටත් අදහසක් ඉදිරිපත් කරන්න තියෙනවා. මේ ප්‍රශ්නය දැන්වත් මේ ගොල්ලන්ට තේරීම ගැන මම සතුටු වෙනවා. මොකක්ද මේක මේ දේශපාලනය අධ්‍යාපනයට සම්බන්ධ කරලා කරපු නිසා තමයි මෙහෙම වෙලා තියෙන්නේ. එක එක කාල වල එක එක ඇමතිවරු ආවහම ඒ ඇමතිවරු තමයි අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කරන්නේ. එතකොට එහෙම උනහම ඩී එස් සේනානායක පාසල නගරයේ තියෙන ආදර්ශ පාසල බවට පත් කරා. එතකොට ඒකට නගරයේ ඉන්න හොඳ ගුරුවරු ඉන්ටර්විව් කරලා ගත්තේ. ඒ අරගෙන ඒකට අසීමිත ලෙස පහසුකම් දීලා සකස් කලා. අපි හැමෝම පෘතජ්ජන මිනිස්සු. එතනදී අපි හැමෝම අපේ දරුවන් හොඳ පාසලකට දාන්න මහන්සි ගන්නවා. විජයපුර ඉස්කෝලේ ළමයි දහයයි පළමු ශ්‍රේණියට. 20 - 100 බිල්ඩින් එකක් තියෙනවා ගිහිල්ලා බලන්නකෝ., සම්පත් නැහැ. වන්න ලේසියි. නමුත් සම්පත් නෑ දීලා. ආදර්ශ කියන ප්‍රාථමික පාසල් වලට නවෝදා කියලා පාසල් කාණ්ඩයක් ඇති කරා. මෙහෙම නමින් වර්ගීකරණය කරන කොට මිනිස්සු විදිහට අපි හැමෝම ඒ පාසල්වලට දරුවෝ ගෙනිහිල්ලා ඇතුළත් කරනවා. එහෙම පෙළඹුන නිසා තමයි ඩී එස් සේනානායක විද්‍යාලයට දරුවන් වැඩි වුනේ. පන්ති 12 දක්වා ගියා. පන්ති 05 ක් 06 ක් යද්දි දෙමව්පියන්ගේ සල්ලි වලිනුත් හැදුවා. ඒ හැම පංති කාමරයකට එපා කියද්දි ඒ සම්පත් ලබා දුන්නා. මම ඩී.එස්. ඉස්කෝලෙට යන්නවත් කැමති වුනේ නෑ. මම යහලේගම හිටියා ළමයි හතරදෙනයි පන්තියෙ . අපි වෙනම program එකක් කරලා ළමයි හැත්ත දෙකක් දක්වා පාසලේ ළමයි සංඛ්‍යාව වැඩි කරා. ඒ හින්ද මේ රටේ සම්පත් බෙදී යාමේ අසීමිත බවක් තියනවා. තැන් වලට පොඩ්ඩක්වත් නෑ. ඊලඟට යන ගුරුවරුන්ට පහසුකම් නෑ දැන් අපි අවුරුදු 11ක් යහලගම ඉගැන්වුවා. මට ට්‍රාන්සර් එක ජේශප් එකට තියද්දි අවුරුදු තුනක් වැඩිපුර යහලේගම විද්‍යාලයේ ඉගැන්නුවා. මගේ යතුරුපැදි දෙකක් කැඩුනා. යන්න පාරවල් නෑ. ඉතිං එහෙම පරිත්‍යාග ශීලීව වැඩ කරපු ගුරුවරුත් ඉන්නවා. මේක ගුරුවරුන්ගේ ප්‍රශ්නයක්වත් කාගෙවත් ප්‍රශ්නයක් නෙමේ. මේක system එකේ වැරැද්දක් තියෙන්නේ. ඒ නිසා මේ ක්‍රමය වෙනස් කරන්න. දැන් ජෝශප් එකට මේ අවුරුද්දේ පන්ති කාමර පහයි තිබුනේ ඒක පන්ති හයක් කළා දෙමව්පියන්ගේ ඉල්ලීම නිසා. ඉතින් ඒ හින්ද මේ ක්‍රමයේ තියෙන වෙනස තමයි මේ චක්‍රලේඛ කොච්චර ගැහුවත් වැඩක් නෑ. මේ සම්පත් බෙදීයාමේ ක්‍රමවේදය වෙනස් කළ යුතුයි.

<u>ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමා</u>

ගරු නගරාධිපති තුමනි, මම හිතන්නේ ඔබතුමා මේ හොඳ කාරණයක් සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු කළේ. මේකෙන් අපිට මම හිතන්නේ මේ ප්‍රශ්නය ඇති වෙන්නෙත් මේ ආදර්ශ ප්‍රාථමික කියන නම් කරල තියෙන හින්ද. මේ ආදර්ශ ප්‍රාථමික කියල තියෙන මූලික ශ්‍රේණි වලට ඇතුලත් කිරීමේ ගැටලුව ඇවිල්ලා තියෙන්නේ ආදර්ශ ප්‍රාථමික කියන අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය නම්කළ පාසල් වගයක්. හැම දෙමව්පියෙක්ම උත්සාහ දැරුවා ඔය පාසල්වලට දරුවන් ඇතුළත් කරන්න.

මූලික වශයෙන් මේකත් එක්ක තමයි මේ ගැටලු ඇති වුණේ. ඒත් එක්කම මේ තදාසන්න නගරය වටේ තියෙන පාසල් 11 ක් පමණ දරුවෝ දාන්නේ නැති ප්‍රශ්නයක් ආවා. මහා බෝධි ඉස්කෝලය, හතරුස්වෙල ඉස්කෝලය, මහින්ද ඉස්කෝලය දැන් ඒ තත්වයට ආවට, විජයපුර ඉස්කෝලය ඔය කියන රත්නායක විද්‍යාලයට දෙමව්පියෝ දරුවෝ දාන්න උත්සාහ කරන්නේ නෑ. හැමෝම උත්සාහ කළේ වෙනත් ඒවට දාන්න.

ඉතිං මේකත් එක්ක තමයි අර ළඟම පාසල හොඳම පාසල කියන සංකල්පයට මම සීයට සීයක් එකඟයි. තියෙන ළඟම පාසල හොඳම පාසල බවට පරිවර්තනය කරද්දි ප්‍රාථමික කියන එක නැති වෙනවා. හැම ප්‍රාථමික යක්ම ආදර්ශයක් හා සමාන සුදුසුකම් බලලා

ගුරුවරු බඳවා ගන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ හැම ගුරුවරයා ම සමාන නම් ඒ ලබා දෙන හැම පහසුකමක්ම සමාන වියයුතුයි. එහෙම නැත්නම් අපහසුකම් හැමෝටම පොදුවේ තිබියයුතු. ඉතින් ඒකයි මේ ගැටලුව.

පාසල්වලට ළමයි ඇතුළත් කිරීමට පදනම් හයක් සලකා බලනවා, සහෝදර පදනම, ආදීශිෂ්‍ය පදනම, අධ්‍යාපන අමාත්‍යංශ වගේ ආයතනවල අයට විශේෂ සැලකිල්ලක් තියනවා. වාර්ෂික ස්ථාන මාරු සහ ස්ථිර පදිංචිය. ඒකෙන් මේ ආසන්න පදනම කියන එක යටතේ තමයි නගර සභාව සම්බන්ධ වෙන්නේ හෙට්අරච්චි මන්ත්‍රීතුමා දන්නවා ඔය පන්තිකාමර වැඩි කරා කියලා සම්මුඛ පරික්ෂණයට එන දරුවන් ඒකට දාන්නේ නෑ. විදුහල්පතිතුමාට ඕන ටිකයි පළාත් අධ්‍යාපන ඇමතිවරයාට ඕනේ ටිකටි. ඉතුරුවා දේශපාලනඥයන්ට ඕන ටිකයි පුරවන්නේ .

මේකෙදි අනෙක් කරුණ තමයි නගර වැසියන්ට මොකක්ද බලපාන්නේ කියන එක. එහි දී ආසන්න පදනම මත කියන එක ගැනනේ මේ තර්ක කරන්නේ . නගර සභා සීමාව කියන එක නෙමේ. අනුරාධපුර නගරයේ කීයෙන් කීදෙනාටද ඔප්පු තියෙන්නෙ. ඔප්පු කියන තැනින්ම සම්මුඛ පරික්ෂණයේ දී කැපිල යනවා . එහෙම වෙන්නේ ඒක සනාථ කරන්න බැරි වෙන හින්දා. ඔප්පු තාත්තාගේ නම නම් තියෙන්නේ පුතා පදිංචි වෙලා ඉන්නවා . සමහර ඉඩම් වලට බලපත්‍ර තියෙන්නේ, සින්නක්කර ඔප්පු නැහැ. ඉතින් මෙන්න මේ වගේ ප්‍රශ්න වලින් තමා මේ නගරයේ ළමයින් පාසලට ඇතුලත් කර ගන්න බැරි වෙන්නේ. මේ පිළිබඳ අවධානය යොමු කිරීම හොඳයි. ඔබතුමා හොඳ වාර්තාවක් හදලා යොමු කරන්න ආණ්ඩුකාරතුමාට. මේ නිර්ණායක ඉවත් වෙන්න ඕනේ පදිංචිය තහවුරු කිරීම. දැන් ඔප්පු නෑ කියන එක, ඒක ඒ පුද්ගලයන්ගේ වැරැද්දක් නෙවෙයි. ප්‍රාදේශීය ලේකම්ගේ වගකීමක් ඒක. එක ඡන්ද නාම ලේඛනයක් වුවත් ඒක ගන්නවා නම් එක නිර්ණායකයක් තිබිය යුතුයි. පන්තිකාමර වැඩි කරලා වත් ආසන්න තාවය මත බඳවා ගන්න බැහැ මොකද ඔක්කොම මේ නගරේ පාසල් වලට ළමයි ඇතුලත් කරන්න බලාගෙන තමා ඉන්නේ. බොහොම ස්තුතියි...

## 05. ස්ථාවර කමිටු වාර්තා සම්මත කර ගැනීම.

✍ ***මුදල් ස්ථාවර කමිටුවේ සාමාජිකත්වය දරණ ගරු නාගරික මන්ත්‍රී නීතීඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා මෙතෙක් පැවති මුදල් ස්ථාවර කමිටු රැස්වීම් සඳහා සහභාගී නොවූ බැවින් එතුමා සාමාජිකත්වයෙන් ඉවත් කර නව සාමාජිකයෙක් පත් කිරීමට ගරු නගරාධිපති / මුදල් කමිටු සභාපති විසින් යෝජනා කරන ලදී.***

***ඒ අනුව, ගරු නලීන් සිරිවර්ධන මැතිතුමා සාමාජිකත්වය දරණ පරිසර රථවාහන කටයුතු පිළිබඳ කමිටුවේ සාමාජිකත්වයෙන් ඉවත් කර මුදල් ස්ථාවර කමිටුවේ සාමාජිකත්වයට පත් කිරීමටත්, පරිසර කමිටුවේ පුරප්පාඩුවන සාමාජිකත්වය සඳහා ගරු නාගරික මන්ත්‍රී කේ.ඒ. ඉන්ද්‍රානි මැතිතුමිය පත් කිරිමට වන යෝජනාව ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ආනන්ද දහනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.***

### 5.1. 2018/08/21 වන දින පැවති මුදල් පිළබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සම්මත කර ගැනීම.

*ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී එම්.පී.එම්. අන්සාර් මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයන් ඉදිරිපත් විය.*

❖ ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා විසින් පහත සඳහන් විෂය අංකයන් යටතේ කරුණු පැහැදිලි කර ගැනීම් සිදු කළ අතර, ඇතැම් යෝජනා කරුණු දැක්වීමෙන් අනතුරුව ඇතැම් තීරණ සංශෝධනය විය.
තීරණ අංක 05, 04 , 07, 08, 10, 16, 24, 29, 30, 45, 59, 61, 63, 66, 69, 84, 85

**සංශෝධනයන් -**

04. 2018.08.02 දින පැවති පැවරුම් කමිටුවේ ගත් තීරණ ඇතුලත් වාර්තාව අනුමත කිරිමට තීරණය වු අතර, නව පැවරුම්ලාභියෙකු සඳහා රුපියල් 50,000.00 ක ගාස්තුවක් ද ඥාතී සම්බන්ධතාවයකින් පැවරුමක දී රුපියල් 10,000.00 ක් ද අය කිරීමට තීරණය විය.

59. අනුරාධපුර, සාලියවත්ත, 06 වන පටුමග, අංක 26/සී, නිරෝෂාන් උදයංග සමරවීර යන අය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් කඩ 12 සැමදා කඩමණ්ඩියේ කඩ කාමරයක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම අනුව දැනට වෙළඳාම් නොකරන කඩ කාමරයක් ගිවිසුම් ගත වී ලබා දීමට තීරණය විය.

62. 2018/07/24 දිනැති සී/ස නේට්ව් වේ පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කල ලිපිය අනුව කිලෝ වොට් 10 ක විදුලි ජනක යන්ත්‍රය සමඟ ඇණවුම් කර ඇති ATS යන්ත්‍රය ලබා ගැනීමේ දී මිල ගණන් සංශෝධනයක් වීමක් වී ඇත. මිල ගණන් ඉදිරිපත් කර ඇත්තේ 2017/12/16 දින සිට මසක කාලසීමාවකට වන බවත්, ඇණවුම් කරන දින වන විට වලංගු කාල සීමාව ඉක්මවා ගොස් ඇති බැවින් මිල ඉහළ ගිය බවත් දැනුම් දී ඇත. ඒ සම්බන්ධයෙන් එම ආයතනයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධයෙන් සාකච්ඡා කල අතර, සභා අනුමැතියට යටත්ව ආදාහනාගාරය සඳහා අදාල විදුලි ජනක යන්ත්‍රය සපයා ගෙන ඇති අතර, සංශෝධිත මිල ගණන් පිළිගැනීමට තීරණය විය.

පෙර මිල ගණන - රු. 81,950.00 නව මිල ගණන - 120,750.00

63. පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ අංක 2/1/10/21 (111) දරණ නිල ඇඳුම් නිකුත් කිරීම සම්බන්ධයෙන් ලිපියේ සඳහන් පරිදි ආදායම් පරික්ෂක නිලධාරින් සඳහා නියමිත නිල ඇඳුම් කට්ටලයට ටියුනික් කට්ටලයක් හා දිග කලිසමක් එක් නිල ඇඳුමකට අයත්ය. ඒ සඳහා සපත්තු කුට්ටමක්, පින් කැප් එකක් උරහිස් පළඳනා ජෝඩුවක්, බොත්තම් වැලක්, හඳුනා ගැනීමේ ලංඡන ජෝඩුවක් ඇතුලත් වන බැවින් මෙම ඇඳම් කට්ටලය ලබා දීමට නියමිත ආදායම් පරික්ෂක නිලධාරින් 09 දෙනෙකු මහා නගර සභාවේ රාජකාරි කටයුතු සිදු කරනු ලබයි. ඒ අනුව, මෙම නිලධාරින් සඳහා නිල ඇඳුම් කට්ටල 02 ක් ලබා දීමටත්, එක් නිලධාරියෙකුට නිල ඇඳුම් කට්ටල 02 ක් සඳහා වැය වන මුදල රුපියල් 14000/- ක මුදල නිල ඇඳුම් දීමනාවක් ලෙස නිල ඇඳම් මසා නිම කර ගැනීමෙන් අනතුරුව නිලධාරින් 09 දෙනා සඳහා අදාල ගෙවීම් කිරීමට තීරණය විය.

84. කුම්බිච්චන්කුලම වැව ආසන්නයේ නගර සභාව වෙනුවෙන් වෙන් කර ඇති අංක 01 කොටසට අයත් ඉඩම මහා නගර සභාව වෙනුවෙන් ශරීර සුවතා මධ්‍යස්ථානයක් ඉදි කිරීමට යොදවා ගැනීමට තීරණය වූ අතර, ඊට අදාල ඇස්තමේන්තුව සකස් කර ඉදිරි මුදල් ස්ථාවර කමිටුවටකට යොමු කිරීමට ද තීරණය විය.

❖ ගරු නාගරික මන්ත්‍රී නීතීඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා විසින් පහත සඳහන් විෂය අංකයන් යටතේ කරුණු පැහැදිලි කර ගැනීම් සිදු කළ අතර, ඇතැම් යෝජනා කරුණු දැක්වීමෙන් අනතුරුව ඇතැම් තීරණ සංශෝධනය විය.

තීරණ අංක 07, 08 ,
12 - ප්‍රතිපත්තිමය විරෝධය,
13 - ප්‍රතිපත්තිමය විරෝධය,
24,
30 - සියළු කොට්ඨාශ වල සිදු කිරිම යෝග්‍ය බවට යෝජනා කරන ලදී.
31,40,42,87,51,52,55,56 - ටෙන්ඩර් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.
60, 68, 73, 74, 84, 91, 93

සංශෝධනයන්

93. මහා නගර සභාවේ සේවයේ නියුතු අනියම් / ආදේශක / කොන්ත්‍රාත්/දීමනා / ව්‍යාපෘති කම්කරුවන් ගේ මෙතෙක් රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නොගෙවන අය වේ නම් මින් ඉදිරියට එම දායක මුදල් අය කර යැවීමට කටයුතු කිරීමට තීරණය විය.

❖ ගරු නාගරික මන්ත්‍රී සුරංගි ආර්. සමරතුංග මැතිතුමිය විසින් පහත සඳහන් විෂය අංකයන් යටතේ කරුණු පැහැදිලි කර ගැනීම් සිදු කර ගන්නා ලදී.

තීරණ අංක 60

❖ ගරු නාගරික මන්ත්‍රී ප්‍රියදර්ශනි කාරියවසම් මැතිතුමිය විසින් පහත සඳහන් විෂය අංකයන් යටතේ කරුණු පැහැදිලි කර ගැනීම් සිදු කර ගන්නා ලදී.

තීරණ අංක 84

❖ ගරු නාගරික මන්ත්‍රී ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා විසින් පහත සඳහන් විෂය අංකයන් යටතේ කරුණු පැහැදිලි කර ගැනීම් සිදු කළ අතර, ඇතැම් යෝජනා කරුණු දැක්වීමෙන් අනතුරුව ඇතැම් තීරණ සංශෝධනය විය.
තීරණ අංක - 04, 05, 13, 20, 23, 36, 58

**සංශෝධන -**

20. අනුරාධපුර, තම්මැන්නාකුලම, අංක 601/72 සී, ලිපිනයේ පදිංචි එච්.එම්. දීපානි නිරංජලා මිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින්, තම පුතා නමින් රුපියල් 1,000.00 ක ශිෂ්‍යාධාර මුදලක් 2018 ජුලි මස සිට ලබා දීමට අනුමත වී ඇති බවත්, එකී ශිෂ්‍යාධාර මුදල මීට පෙර වසර වල දී ද ලබා ගත් බැවින් මෙම වර්ෂයේ මුල සිට ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම පිළිබඳව සාකච්ඡා කරන ලදී. එහි දී 2018 ජුලි මස සිට ශිෂ්‍යාධාර මුදල් ගෙවීමට ලබා ගත් සභා තීරණය එලෙසම ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

❖ ගරු නාගරික මන්ත්‍රී එච්.බී. සීතා හේරත් මැතිතුමිය විසින් පහත සඳහන් විෂය අංකයන් යටතේ කරුණු පැහැදිලි කර ගැනීම් සිදු කර ගන්නා ලදී.

තීරණ අංක 07, 56 - ටෙන්ඩර් කර ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.
78, 79, 80

➢ ගරු නාගරික මන්ත්‍රී සමන් ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා විසින් තීරණ අංක 31 සම්බන්ධයෙන් තම එකඟතාවය ප්‍රකාශ කළ අතර, එමගින් පහත සඳහන් සමිති සඳහා ද ප්‍රජා ශාලා ගොඩනැගිල්ලක් ඉදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ඉල්ලීමක් කරන ලදී.
   I. සමගි අවමංගල්‍ය හා අන්‍යෝන්‍යාධාර සමිතිය
   II. ප්‍රිය මිතුරෝ සුභ සාධක සංගමය

**මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තා සම්මත කර ගැනීම සඳහා ඡන්දය විමසීම.**

| | | | |
|---|---|---|---|
| 1. | එච්.පී. සෝමදාස මැතිතුමා | - | පක්ෂව |
| 2. | එම්.ඩබ්. බුද්ධික ප්‍රේමදාස මැතිතුමා | - | පක්ෂව |
| 3. | ආනන්ද දහනායක මැතිතුමා | - | පක්ෂව |
| 4. | ආර්.ඩී.කේ. සුසිල් තිලකරත්න මැතිතුමා | - | පක්ෂව |
| 5. | ඒ.එම්.පී. අන්සාර් මැතිතුමා | - | පක්ෂව |
| 6. | නලීන් සංජීව සිරිවර්ධන මැතිතුමා | - | පක්ෂව |
| 7. | දුමිඳු දයාසෙන් රැටියල මැතිතුමා | - | පක්ෂව |
| 8. | නීතිඥ රංජිත් රාජකාරුණා මැතිතුමා | - | පක්ෂව |

9. එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මැතිතුමා - පක්ෂව
10. ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී. වීමුක්ති රණවීර මැතිතුමා - පක්ෂව
11. සුපිනි සඳමාලී මැතිනිය - පක්ෂව
12. නදීර ප්‍රභාත් ධර්මදාස මැතිතුමා - පක්ෂව
13. එස්.ආර්.ඒ. සුරංගි රේණුකා සමරතුංග මැතිනිය- පක්ෂව
14. එම්.ඩී.කේ. විනෝදනි විජේසූරිය මැතිනිය - පක්ෂව
15. කේ.පී. සචිනි නිමේෂා මැතිනිය - පක්ෂව
16. කේ.එච්. ඉන්දික අරුණ කුමාර මැතිතුමා - තීරණ අංක 18,19,20,21,22,25,26,27,32,35 කරුණු සඳහා පමණක් එකඟ වන ලදී.
17. නීතිඥ ජේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා -තීරණ අංක 18,19,20,21,22,25,26,27,32,35 කරුණු සඳහා පමණක් එකඟ වන ලදී.
18. ජේ.එම්. සමන් ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා -තීරණ අංක 18,19,20,21,22,25,26,27,32,35 කරුණු සඳහා පමණක් එකඟ වන ලදී.
19. රශ්මික ගමආරච්චි මැතිතුමා -තීරණ අංක 18,19,20,21,22,25,26,27,32,35 කරුණු සඳහා පමණක් එකඟ වන ලදී.
20. ඩී. ජී. ජේමදාස මැතිතුමා -තීරණ අංක 18,19,20,21,22,25,26,27,32,35 කරුණු සඳහා පමණක් එකඟ වන ලදී.
21. ජී.ඒ. ශිවන්ත මලික් කුමාර මැතිතුමා -තීරණ අංක 18,19,20,21,22,25,26,27,32,35 කරුණු සඳහා පමණක් එකඟ වන ලදී.
22. ආර්.ඒ. විමල් රවීන්ද්‍ර රණසිංහ මැතිතුමා -තීරණ අංක 18,19,20,21,22,25,26,27,32,35 කරුණු සඳහා පමණක් එකඟ වන ලදී.
23. නීතිඥ කේ.එස්.ටී. නිර්මලි ප්‍රියදර්ශනි මැතිතුමිය-තීරණ අංක 18,19,20,21,22,25,26,27,32,35 කරුණු සඳහා පමණක් එකඟ වන ලදී.
24. කේ.ඒ. ඉන්ද්‍රානි මැතිතුමිය -තීරණ අංක 18,19,20,21,22,25,26,27,32,35 කරුණු සඳහා පමණක් එකඟ වන ලදී.
25. ඩබ්.ජී.සී.කේ. ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා-

**ඡන්දය ලබා දීමෙන් වැලකී සිටිම -**

1,2,3,4,7,8,11,13,23,30,31,32,34,38,40,43,45,46,47,48,49,50,51,54,55,57,59,64,66,67,68,69,70,71,72,73,74,75,76,77,78,79,80,81,82,83,84,87,88,91,92

**එකඟවීම-**

9,10,12,14,15,16,17,18,19,20,21,22,25,26,27,28,29,33,39,41,42,44,52,53,60,62,63,65,85,89,90,93,94

**විරුද්ධවීම්** - 5,24,35,36,37,56,58

26. එච්.බී. සීතා හේරත් මැතිනිය

**ඡන්දය ලබා දීමෙන් වැලකී සිටිම -**

1,2,3,4,7,8,11,13,23,30,31,32,34,38,40,43,45,46,47,48,49,50,51,54,55,57,59,64,66,67,68,69,70,71,72,73,74,75,76,77,78,79,80,81,82,83,84,87,88,91,92

**එකඟවීම-**

9,10,12,14,15,16,17,18,19,20,21,22,25,26,27,28,29,33,39,41,42,44,52,53,60,62,63,65,85,89,90,93,94

**විරුද්ධවීම්** - 5,24,35,36,37,56,58

27. එම්.එස්.එම්. අල් ෆාරීස් මැතිතුමා - නිහඬයි

- පක්ෂව ඡන්දය ලබා දීම - 15
- විරුද්ධත්වය සහ පක්ෂව හා ඡන්දය ලබා දීමෙන් වැලකි සිටීම - 12
- නොපැමිණීම - 02

ඉහත පරිදි ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව මුදල් ස්ථාවර කමිටු වාර්තා වැඩි ඡන්ද 15 න් සභා සම්මත විය.

5.2 2018/08/13 දින පැවති සෞඛ්‍ය , ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සම්මත කර ගැනීම.

**ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමාගේ සහ ගරු නාගරික මන්ත්‍රී නදීර ප්‍රභාත් ධර්මදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයන් ඉදිරිපත් විය.**

5.3 2018/08/13 වන දින පැවති නිවාස ක්‍රීඩා, සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සම්මත කර ගැනීම.

**ගරු නාගරික මන්ත්‍රී දුමිඳු දයාසෙන් රැටියල මැතිතුමාගේ සහ ගරු නාගරික මන්ත්‍රී සුපිනි සඳමාලි මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයන් ඉදිරිපත් විය.**

5.4 2018/08/14 වන දින පැවති නව ආයෝජන, ආදායම් උත්පාදන, ඉඩම් හා දේපල නිරවුල් කිරීමේ කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සභා සම්මත කර ගැනීම.

**ගරු නාගරික මන්ත්‍රී නීතීඥ රංජිත් රාජකාරුණා මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී විනෝදනි විජේසූරිය මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයන් ඉදිරිපත් විය.**

✍ **කමිටු සභාපති නීතීඥ රංජිත් රාජකරුණා මැතිතුමා විසින් කමිටු වාර්තාවේ ප්‍රගති සාමාලෝචනය 01 යටතේ කර තිබූ සටහන ඉවත් කළ අතර, ඒ වෙනුවට එතුමා විසින් සභා ගත කරන ලද යෝජනාවේ තීරණය ඇතුලත් කර සංශෝධනය කිරීමට යෝජනා කරන ලදී.**

5.5 2018/08/14 දින පැවති පරිසර, කෘෂිකර්ම හා රථවාහන කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සම්මත කර ගැනීම.

**ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමාගේ සහ ගරු නාගරික මන්ත්‍රී එම්.පී.එම්. අන්සාර් මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයන් ඉදිරිපත් විය.**

✍ ගරු නියෝජ්‍ය නගරාධිතිතුමා විසින් යෝජනාවක් කරමින් පරිසර කමිටුව සඳහා රථ වාහන පොලිසියේ නිලධාරියෙකු සෑම මසකම සහභාගී කරවා ගැනීමට කටයුතු කිරීමට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි වෙත දැනුම් දීමට යෝජනා කරන ලදී**.**

5.6 2018/08/16 දින පැවති යටිතල පහසුකම්. පුස්තකාල, තොරතුරු තාක්ෂණ හා පුහුණු කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සම්මත කර ගැනීම.

**ගරු නාගරික මන්ත්‍රී නලීන් සිරිවර්ධන මැතිතුමාගේ සහ ගරු නාගරික මන්ත්‍රී එම්.පී.එම්. අන්සාර් මැතිතුමාගේ යෝජනා ස්ථීරත්වයන් ඉදිරිපත් විය.**

5.7 2018/08/16 දින පැවති සමාජ සවිබල ගැන්වීම හා ජීවනෝපාය සංවර්ධන කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සම්මත කර ගැනීම.

**ගරු නාගරික මන්ත්‍රී එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මැතිතුමාගේ සහ ගරු නාගරික මන්ත්‍රී තීක්ෂණ විමුක්ති රණවීර මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයන් ඉදිරිපත් විය.**

5.8 2018/08/17 වන දින පැවති කාන්තා කටයුතු , පූර්ව ළමාවිය, ළමා හා මාතෘ සායන පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්තාව සම්මත කර ගැනීම.

**ගරු නාගරික මන්ත්‍රී සුපිනි සඳමාලි මැතිතුමිය ගේ සහ ගරු නාගරික මන්ත්‍රී සුරංගි ආර්. සමරතුංග මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයන් ඉදිරිපත් විය.**

<u>ගරු නාගරික මන්ත්‍රී සුපුනි සඳමාලි මැතිතුමිය.</u>

ගරු නගරාධිපතිතුමනි, සුරංගි මන්ත්‍රීතුමිය කමිටුවට යෝජනාවක් කරා සෙමෙන් වැඩෙන දරුවන් සඳහා පෙර පාසලක් ඉදිකිරීම සම්බන්ධයෙන් . ඇත්තටම කාලීන මාතෘකාවක් මම ඒක මහා සභාවට යෝජනාවක් විදිහට ගේන්න කමිටුව ගත්ත තීරණයක් මගින් ස්ථිර උනා එතනදී. එනමුත් ඒ යෝජනාව මහා සභාවට ඇවිත් නැහැ.

<u>ගරු නගරාධිපතිතුමා.</u>

මන්ත්‍රීතුමිය ඒ වගේ දේකට මහා නගර සභාව මැදිහත් වෙන්න අමාරුයි. හා නොමේරූ දරුවෝ සඳහා ඒ වගේ වැඩසටහනක් කරන්න පූර්ව ළමාවිය සංවර්ධනය අධිකාරිය වගේ ඒවා තියෙනවා. මේ නගර සභාවේ එකට කටයුතු කරන්න අමාරුයි මන්ත්‍රීතුමිය. මේ ගැන ටිකක් මං හොයලා බැලුවා එනිසා....

අනිත් කරුණ මන්ත්‍රීතුමිය අර ලෝක ළමා දිනය සම්බන්ධයෙන් පත්තරේ විස්තරයක් තිබුණා.

<u>ගරු නාගරික මන්ත්‍රී සුපිනි සඳමාලි මැතිතුමිය.</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ පිළිබඳව ලොකු කලකිරීමක් වගේම අදහසක් දක්වන්න ඕනෙ. අපි මේක අගෝස්තු මාසයේ මුදල් කාරක සභාවේ දී මේ වැඩසටහන පිළිබඳ සාකච්ඡා කළා. ඉන් අනතුරුව මහා සභාවේ දී මේ සම්බන්ධයෙන් දිගින් දිගටම සාකච්ඡා වුණා. එහිදී නගරාධිපතිතුමා ප්‍රකාශ කළේ අපි මේ යෝජනාව ගෙනාවේ නගරේ දූදරුවන් වෙනුවෙන්. මේ යෝජනාව ගෙනාවට පස්සෙ මේ වෙනකොට ලංකාවේ ප්‍රසිද්ධ විද්‍යුත් මාධ්‍ය ආයතනයක් වන නෙත් එෆ් එම් ආයතනය ඉදිරිපත් වෙලා තියෙනවා මේ වැඩසටහන කරන්න කියලා. නමුත් එවැනි ප්‍රකාශයක් කරලා තියෙද්දිත් මෙවැනි පත්තර වලට ප්‍රකාශ කිරීම කමිටු සභාපති හැටියටත් නගරයේ දූ දරුවන් එක්ක ඉන්න කෙනෙක් හැටියටත් මම දැඩිසේ විවේචනය කරනවා. මොකද ගරු නගරාධිපතිතුමනි මෙහිදී නගරයේ මන්ත්‍රීවරු කියයි කියලා තමා මේ පත්තරේ තියෙන්නේ.

ලක්බිම පත්තරේ තියෙන්නේ මේ මම මේ මාධ්‍යවේදියාගේ විමසීමක් කරා බුද්ධික මහේෂ් කියන මාධ්‍යවේදියාගෙන් මම විමසීමක් කරා. එතුමා මට විස්තරේ කිව්වා. මම කිව්වා සභාවේ දී මෙවැනි තීරණයක් ගත්ත ඒ නිසා තීරණ ඉවත් වුණා කියලා. ඔහු මගෙන් ඇහුවේ ගරු නගරාධිපතිතුමා මේ පිළිබඳව තොරතුරු ලබා දීපු නිලධාරියා මේ පිළිබඳ දැනුවත් නැද්ද කියලා, ඒ පිළිබඳ ඇත්තටම ලොකු කනගාටුවක් තියෙනවා. මොකද සභාවේ ගත්ත තීරණ සභාවේ රාජකාරි කරන නිලධාරීන් දැනුවත් නෑ කියන එක පිළිබඳව. එතුමා කරන යෝජනාවත් එක්ක මම ලොකු කලකිරීමකට පත් වෙනවා. මේ වගේ වැඩ තවදුරටත් කරන්ඩ එපා මොකද ඒක මහ කාලකන්නි ඉරණමක් වෙනවා නගරයේ දරුවන්ට සහ මේ වගේ කටයුතු ඉදිරිපත් කරන අයට. හරිම ඛේදජනකයි මේ වගේ දේවල් කරන්න එපා. ප්‍රසිද්ධ වෙන්න නම් මීට වඩා සුදුසු තීරණ ගන්න කියලා මම මේ සභාවට යෝජනා කරනවා.

<u>ගරු නගරාධිපතිතුමා.</u>

ලෝක ළමා දිනය ඔක්තෝම්බර් පළමු වන දිනය යෙදිලා තියනවා. එදිනටත් අපි වැඩසටහනක් කරන්න හිටියා. නමුත් ඒක ඒකත් අවලංගු කර 06 වැනිදට නෙත් එෆ් එම් ආයතනයත් එක්ක කරන වැඩසටහන නිසා එකට නගරයේ සහ නගරයෙන් පිට එන්න දරුවො ඉන්නවා නම් සම්බන්ධ කරන්න පුලුවන්.

<u>ගරු නාගරික මන්ත්‍රී සමන් ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා.</u>

ගරු නගරාධිපතිතුමනි , මෙතුමිය කිව්වා අර සෙමින් වැඩෙන දරුවන් පිළිබඳව යෝජනාව. එක කාලෝචිත යෝජනා කියලා මම ප්‍රකාශ කරනවා . අපිට ඒ සම්බන්ධව සම්පත් නොමැති නිසා ඒ පිළිබඳ කටයුතු කළ හැකි ආයතන තියෙනවනම් ඒවා දැනුවත් කරලා කටයුතු කිරීම සුදුසුයයි මා සභාවට යෝජනා කර සිටිනවා.

ගරු නාගරික මන්ත්‍රී ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා පෙර පාසල් සංගණනය පිළිබඳ විස්තර වාර්තාවේ පෙර පාසල් සංඛ්‍යාව පිළිබඳ විමසීමක් කළ අතර, ප්‍රමිතියක් ඇති ලියාපදිංචිය සහිත පෙර පාසල් පිළිබඳ විස්තර පමණක්ම සංගණනයට ඇතුළු කර ඇති බව නාගරික මන්ත්‍රී සුපුනි සඳමලී මැතිනිය විසින් ප්‍රකාශ කර සිටින ලදි.

එතුමා විසින් කමිටු මඟින් ලබා ගන්නා ඇතැම් කරුණු මුදල් ස්ථාවර කමිටුවට යොමු කිරීම හා ඒවා මුදල් ස්ථාවර කමිටුවලින් නොපැමිණීම සම්බන්ධයෙන් විමසීමක් කළ අතර මිල ගණන් ලබාගෙන ඉදිරිපත් කළ යුතු යෝජනා මිල සමඟ ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරන බව ගරු නගරාධිපතිතුමා විසින් පැහැදිලි කිරීමක් කරන ලදී.

මුදල් ස්ථාවර කමිටු අවස්ථාවෙදි න්‍යාය පත්‍ර අනුකූලව කතා කරන කරුණු කාරණා වලට අමතරව අතිරේක න්‍යාය පත්‍රයේ දී කතා කරනු ලබන කාරණා සම්බන්ධව ප්‍රකාශයක් කළ අතර අතිරේක න්‍යාය පත්‍රය ඉදිරිපත් කිරීමේ හේතු මත නැවතත් ඒ සම්බන්ධයෙන් මහා සභාවේ දී අදහස් ප්‍රකාශ කිරීම සහ විමසීම් සිදු කිරීමට සිදුවන බව ගරු නාගරික මන්ත්‍රී ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා විසින් සභාවට දැනුම් දෙන ලදී.

***ඒ අනුව, වැඩි ඡන්ද 15 කින් කමිටු වාර්තා සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.***

<u>**06.** ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාගේ ඉදිරිපත්කිරීම්.</u>

<u>ගරු නාගරික මන්ත්‍රී සුරංගි සමරතුංග මැතිතුමිය.</u>

ගරු නගරාධිපතිතුමනි, දැනට සභා පහකට පෙර මන්ත්‍රීවරියක් විදිහට මේ සභාව නියෝජනය ප්‍රථම වතාවට. මැතිවරණ කාලයේදී විශාල ගැටුම් රැසකට මුහුණ දීලා කාන්තාවක් විදිහට ජනතාවගේ කැමැත්ත අරගෙන සභාවට එනවා. ජනතාවට යම්කිසි කාර්යයක් ඉටු කරන්න. එතකොට, එනකොට අපි හිතුවා අපි ගේන යෝජනා සභා සම්මත වෙනකොට අපි හිතුවා මේවා බොහොම ඉක්මනට ක්‍රියාත්මක වෙයි කියලා. අපි කරන යෝජනා ගරු නගරාධිපතිතුමනි බොහොමයක් ඒවා මුදල් මත පදනම් වෙලා නැහැ. ගරු නගරාධිපති තුමනි මම යෝජනාවක් ගේනවා කාන්තා කටයුතු කමිටුවට මනස සෙමෙන් වැඩෙන දරුවන්ගේ පෙර පාසලක් හදන්න. ඒ ව්‍යාපෘතිය සකස් කරන්න මම ගොඩක් මහන්සි වුණා සහ ඒ සඳහා තොරතුරු එකතු කරන්නන් ගොඩක් උනන්දු වුණා. සභා අරමුදලින් කරන්නට නෙමේ මේක යෝජනාවක් විදියට ගෙනල්ලා සභා සම්මත කරලා NGO වගේ ජෙයිකා වගේ ආයතනවලින් මුදල් ආධාර ලබා ගෙන ස්ථානයක් වෙන්කර ගෙන ඒ සියලු යෝජනා මේ ව්‍යාපෘතියේ ඇතුළත්. සභාවේ වෛද්‍යතුමා ත් මට ගොඩක් තොරතුරු සැපයුවා. ඒ සියලු දේ අරගෙන තමයි මම එතුමියට කාන්තා කටයුතු කමිටුවට ඉදිරිපත් කරන්නේ යෝජනාව' මොන විදිහකින් හරි මේ සභාවේ න්‍යායපත්‍රයට එන්නේ නැහැ. ඒ පිළිබඳ කණගාටුව ප්‍රථමයෙන්ම ප්‍රකාශ කරනවා. ඉදිරියේදී මම ඒක ගෙනල්ලා විස්තරාත්මකව පැහැදිලි කරන්නම්. මොකද මන්ත්‍රීවරුන් විදිහට යම්කිසි දැක්මක් ඇතිව තමයි එන්නේ මෙතැනට ආවට ගියාට යෝජනා ගේන්නේ නැහැ නගරාධිපති තුමනි .

<u>ගරු නගරාධිපතිතුමා.</u>

ඒ පිළිබඳ වරදවා හිතන්න එපා ගරු මන්ත්‍රීතුමනි. මේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දැක්කේ නැහැ තොරතුරක්. මගෙන් ඇහුවා මේක අහන කොටම මට මට හිතුනා මේක ක්‍රියාත්මක කිරීමේදී අපට ගැටලු මතුවෙයිද කියලා. මේක ව්‍යාපෘති යෝජනාව ඔබතුමිය ගෙනල්ලා පොඩ්ඩක් පැහැදිලි කිරීමක් කරන්න.

<u>**නාගරික මන්ත්‍රී සුරංගි සමරතුංග මැතිතුමිය.**</u>

ඔව් ඒ ව්‍යාපෘතිය මම ගෙනාවේ නැහැ, මම ඒක ඔබතුමාට ගෙනල්ලා පැහැදිලිකිරීමක් කරල දෙන්නම්. මනස සෙමින් වැඩෙන දරුවෝ කියල කියන්නේ තිරසාර සංවර්ධනයට බාධාවක් විදියට හැඳින්වෙන වනේ. ආබාධිත දරුවෝ ඒගොල්ලො සමාජය පුරවැසියන් විදිහට තියන්න ඕනේ. එතකොට මම පැහැදිලි කිරීමක් කළොත් දරුවන්ගේ මනස හෙමින් වැඩෙන්නේ ඒ දරුවන්ට අධ්‍යාපනය හෙමින් තමයි ලබා දෙන්න ඕනෙ. නමුත් ඊට පස්සේ ඒගොල්ලො අන්තර් කරන අධ්‍යාපනයට යොමු කරන්න ඕන. ඒ දරුවන්ව අවුරුදු 2  1/2 සිට 8 දක්වා යම් කිසි පෙර පාසලක් නැහැ අනුරාධපුර දිස්ත්‍රික්කයේ. මම හොයලා බැලුවහම මහනුවර තියෙනවා , කොළඹ තියෙනවා ඒ දරුවන්ව යම්කිසි ප්‍රමිතිකරණයකට හදලා ඇතුළත් කරලා අධ්‍යාපනය ලබා දෙන්න කටයුතු කරන්න මම මේ ව්‍යාපෘතිය ඉදිරිපත් කරනවා. මේ සම්බන්ධයෙන් සියලු සමීක්ෂණ කරලා තියෙන්නේ ගරු නගරාධිපති තුමනි.

ඒ වගේම තමයි ගරු නගරාධිපතිතුමනි මහජන නියෝජිතවරියක් හැටියට මගේ කොට්ඨාසයේ  ප්‍රශ්න විතරක් නෙමෙයි, සභාවේ සේවකයන්ගේ ප්‍රශ්න පවා අපිට සේවකයෝ ගේනවා. ඇත්තටම මේක මම දකින විදිහට යම්කිසි ආයතනයක ප්‍රධානියා හෝ වගකිව යුතු නිලධාරියා පියෙක් තම දරුවා බලාගන්නවා වගේ තමයි තමන්ගේ සේවකයින් බලාගත යුතු වෙන්නේ. එතකොට මට මේ මහ නගර සභාවේ සේවකයන් තුන් දෙනෙක් ඉදිරිපත් කරා ඒගොල්ලන් සේවයෙන් අවසන් කරලා. මොන හේතු කාරණා නිසා අයින් කරලා ද දන්නේ නෑ. එක පාරම ලියුම දීලා. ගරු නගරාධිපති තුමනි අපි ගෙදර දරුවකුට දඬුවමක් දෙනකොට ඒක ඉතාම බරපතළ විදිහට ඒ දඬුවම දෙන්න හොඳ නෑ. පොඩ්ඩ පොඩ්ඩ හෙමින් හදල ගන්න ඕනේ.

මේ සෞඛ්‍ය කම්කරුවන් මහා නගර සභාවේ සෞඛ්‍ය කම්කරුවන් මම දකින්නේ අපිට වටිනා සම්පතක් හැටියට. මේ සේවකයෝ ඒ ගොල්ලන්ගෙ සේවය නතර කලොත් මේ මුළු නගරයම ගඳ ගහන තත්ත්වයකට පත් වෙනවා. එතකොට ඒ වගේ අයගේ රාජකාරිය කරගෙන යනකොට නීති විරෝධී ක්‍රියා සිද්ධ වෙනවා. ඒ සේවකයන්ට කෙලින්ම දඬුවම් කරනවාට වඩා ගරු නගරාධිපති තුමනි මම යෝජනා කරනවා ඒගොල්ලන්ව විනය පරීක්ෂණයකට යොමු කරලා ඒ වගේ දේකට යොමු කරලා මේ අයට සේවය අවසන් කරාට කමක් නෑ. මේ වෙන කොට මම දකින අය සේවය අවසන් කරපු තුන්දෙනෙක් මත්ද්‍රව්‍ය වලට යොමු වෙලා. පවුලත් කඩාකප්පල් වෙලා. ඒ තත්වෙට පත්වෙලා ඒකට වගකිව යුතු එක්තරා කොට්ඨාශයක් බවට අපි පත් වෙලා කියලා හිතනවා. ඒ කියන්නේ ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම කුණු අදින්න හැමෝම ඉදිරිපත් වෙන්නෙ නෑ. ඉතින් ඒවගේ සේවකයන් අපි මේ සභාව ඇතුලේ පුටුවල වාඩිවෙලා ඉන්න අයට වඩා අපි ඒ ගොල්ලන්ව රැකගත යුතුයි කියන අදහස මම ඔබතුමාට ඉදිරිපත් කරනවා.

එ් වගේම ගරු නගරාධිපති තුමනි ඔබතුමා කොට්ඨාස මට්ටමෙන් සංවර්ධනය කිරීමට මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු කරන්න ආරම්භ කරලා තියෙනවා ඒවා හදාගෙන යනවා. ඒ සම්බන්ධව කටයුතු කරගෙන යනවා. ඒ සම්බන්ධ මගේ ස්තුතිය ප්‍රකාශ කර සිටිනවා.

<u>**ගරු නාගරික මන්ත්‍රී ඩී. ජී ප්‍රේමදාස මැතිතුමා.**</u>

ගරු නගරාධිපතිතුමා අනුරාධපුර  පූජා නගරයට දිනපතා බැතිමතුන් සහ ජනතාව පැමිණෙනවා. මේ පැමිණෙන ජනතාවට පොදු පහසුකම් සළසා දිය යුතුයි කියන එක මම මේ අදහස් කරන්නේ . අනුරාධපුර නගරයේ පොදු වැසිකිළි හදන්න කියලා මම යෝජනා කරනවා. ගරු නගරාධිපතිතුමනි, අනුරාධපුර නගරය ගත්තමහ  බොහොම වටිනාකමක් තියෙන පෞරාණික වටිනාකමක් තියෙන නගරයක් වශයෙන් හඳුන්වන්න පුළුවන්. **මේකේ** අපි අනුරාධපුරෙන් පටන් ගත්තොත් නව නගර බස් නැවතුම්පොළ පිටුපස එතකොට ඒ අතුරු මාර්ගවල උදේට යන්න බෑ **දුර්ගන්ධය.. ඒ** නිසා ඉතින් මහා මුදලක් වැය කරනවා මාසෙකට මේ අනුරාධපුර නගරයේ යම් යම් කටයුතු සම්බන්ධයෙන්. මේකට ක්‍රමවත් වැඩපිළිවෙළක් අපි හිතමු . දවසගානේ අයින් කරන්න පුළුවන් ලෑන්ඩ් මාස්ටර් එකක් හරි මහ ටැක්ටර් ටේලරයක් හරි මාර්ගය අයිනේ නවතා තියන්න.  එම ක්‍රමය දැන් මං බැලුවා මේ මහා නගර සභා ආඥා පනතේ තියෙනවා වීථියක හෝ මෙය තියන්න ජනතාවගේ පහසුකම් වෙනුවෙන් පාවිච්චි කිරීමේ අයිතිය සභාව සතුව තියෙනවා. අනුරාධපුර මහා නගර සභාවවේ වත් මේ ක්‍රමය පටන් ගමු. මේක ලංකාවටම ආදර්ශයක් වෙයි. අපි උදාහරණයක් වශයෙන් ගත්තොත්  ගරු නගරාධිපතිතුමා අපට පුළුවන් අනුරාධපුර නගරයේ තියෙන ඉන්ධනහල් වලින් ප්‍රදර්ශනය කරන්න.

මේ නගර සභාව විසින් අපි මේ සෑම ඉන්ධන හලකම මේ පහසුකම් තියෙන්න ඕනේ වගේම අද මේ නගරයේ තියෙන උපකාරක පන්ති වලට එන දරු දැරියන්ට ඒ අදාළ පහසුකම් ලැබෙනවද කියලා බලන්න ඕනේ. ඒ වගේම නගරාධිපතිතුමනි මේ වෙළඳසැල්වල දැන් අපි දන්නවා අනුරාධපුර නගරය ආශ්‍රීතව කඩවල්වල මේ එකක්වත් තේ එකක් බොන්න යන්ඩ පහසුකම් නැහැ.  ඒ පහසුකම් අපි හරිගස්ස ගන්න ඕනේ. අපි කොළඹ ගියත් ඒ වගේ තමයි බොහොම අඩු තැනක තමයි පොදු පහසුකම් තියෙන්නේ. මම මේ ඉල්ලන්නේ පොදු පහසුකම්වලට දැන් අනුරාධපුරය මාර්කට් පෙදෙසට ආපු කෙනෙක් අතර මග අවශ්‍යතාවයක් වුණොත් ඒ අවස්ථාවේ ඉටුකර ගැනීමට විදිහක් නෑ. ඒ වගේ මේක ප්‍රදර්ශනය කිරීමක් කළ යුතු වෙනවා. මේ යෝජනාව සභා සම්මත කරලා හරි

මේ සම්බන්ධව ඉදිරි කටයුතු කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා. පූජා නගරයේ සම්බන්ධව ගත්තහම අපිට මේ දැනට ක්‍රියාත්ම කරන ක්‍රමය " වල " වැසිකිලි ක්‍රමය විධිමත්ව හදනවා නම් හොඳයි කියලා හිතෙනවා.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

අපි දැන් කන්ටේනර් 5ක් ගෙනල්ලා වැසිකිලි හදනවා. බජට් එකෙන් ඒකට තව හතළිහක් එකතු වෙනවා අපි ගහනවට වැසිකිලි පන්සියයක් කන්ටේනර් වලින්. ඒ සඳහා කටයුතු ඉදිරියේදී කරනවා එතකොට මෙම පවතින අඩුපාඩු සපුරාලන්න පුළුවන් වෙයි.

**<u>ගරු නාගරික මන්ත්‍රී ඩී.ජී. ප්‍රේමදාස මැතිතුමා</u>.**

ගරු නගරාධිපතිතුමානි, අපි කොච්චර පොදු වැඩසටහන් සඳහා මුදල් වියදම් කරත් වැඩක් නෑ . ඒ දේවල්වලින් මහජනතාවට ප්‍රයෝජනයක් නැත්තං. බලාපොරොත්තු වනවා ඉදිරියේදී මේ යෝජනා ක්‍රියාත්මක කරයි කියලා.

**<u>ගරු නාගරික මන්ත්‍රී රශ්මික ගමආරච්චි මැතිතුමා</u>**

ගරු නගරාධිපතිතුමනි, මං මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා බන්ධනාගාරගතව සිටින එළිමහන් රැඳවියන් සඳහා මහජන පුස්තකාලයෙන් ඉවත් කරනු ලබන පොත් ඇත්නම් ඒවා ඔවුන්ගේ පරිහරණය සඳහා ලබාදීමට කටයුතු කරන ලෙස.

**<u>ගරු නගරාධිපතිතුමා,</u>**

ඔබතුමාට ඒක අපි බලලා ඒ පොත් ලබා දෙන්න කටයුතු කරන්නම්.

**<u>ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමනි, 255 කොට්ඨාශය මගේ තුලානේ පහුගිය කාලයේ කාණු පද්ධති සහ වෙනත් අපද්‍රව්‍ය සම්බන්ධව ඔබතුමාට මතක් කර පමණින් ඔබතුමා දිනයක් යොදාගෙන අපේ පවිත්‍ර පුර ප්‍රදේශය කාණු පද්ධති මාර්ග දෙපස ඒ වගේම එදිනම සුනක එන්නත් කිරීම ඒ වගේම බෝ නොවන රෝග සම්බන්ධව සායනයක් ඒවගේම ගලි බවුසර 50% ක සහන මුදලකට ලබා දීමට උදේ සිට හවස දක්වා විශාල මෙහෙයුමක් කරලා. පවිත්‍රතා සිදුකළා ඉතිං මේ සම්බන්ධව ඔබතුමා, නලින් මන්ත්‍රීතුමා, රැටියල මන්ත්‍රීතුමා සහභාගිවුණා. ඒ අයටත් නාගරික කොමසාරිස් ඇතුළු අපේ පරිපාලන නිලධාරි තුමා ඇතුළු සෞඛ්‍ය අංශයේ ප්‍රධාන නිලධාරීන් සහ සියලුම කාර්ය මණ්ඩලයටත් වෛද්‍ය මාධව මැතිතුමා සහ ඉංජිනේරුතුමා ජයම්පති මහතා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලය සහ යම්කිසි ආකාරයකින් මතක් කිරීමක් සිදු නොවුණා නම් මේ සියලු දෙනාටමත් ප්‍රදේශවාසීන් වෙනුවෙන් මගේ හෘදයංගම ස්තූතිය මම පුදකර සිටිනවා

ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, ආර්.ඩී. එකෙන් මේ මාර්ගය දෙපස තිබූ පදික වෙළඳසැල් ඉවත් කිරිමක් කළා. ඒ සියලු දෙනා දෛනික තමන්ගේ වෘත්තියක් වශයෙන් මේ කාර්යය කරන්නේ ඒකෙදි කිව්වා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන්න ඕන කියලා. මම හිතන්නේ එහෙම අවශ්‍ය නැහැ. මොකද මහා මාර්ග හා ආඥා පනතට අයත් වෙන්නැති කාර්යයක් තමයි අපි මේ අයව දැනුවත් කරන්න යන්නේ. මේ සියලුම වට රවුම් මාර්ග දෙපස මේ හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා ගිය පාර මතක් කරා. මේවට ඒ අයගෙන් අහන්න අවශ්‍ය නෑ. පනතෙන් බලයෙන් අපට තියෙනවා. මේ ක්‍රියාදාමය සිදුකිරීමට එනිසාම මේ ගරු සභාවේ දී මතක් කර සිටිනවා මේ අයව දැනුවත් කරලා මේ ඇයට හෙට දිනයේ සිටම මේ වෙළඳාම් කටයුතු කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා.

ඒ වගේම තමයි ගරු නගරාධිපතිතුමනි මුලින්ම යෝජනාවක් ගෙනාවොත් ඉවත් කිරීමක් නම් ටක් ගාලා කරනවා. සෝභා උයන දැන් පස්වැනි මාසේ 20 ගිවිසුම අවලංගු කරලා . ඊළගට එයට මුදල් අයකර ගන්න සභාවට මුදල් කර ගන්නා ආකාරය දැනුවත් කිරීමක් කරන්නේ නෑ. ඊට පස්සේ මේ කමිටු තීරණයක් අරන් තියනවා මේක නැවත සභා මගින් ක්‍රියාත්මක කරන්න. දැන් පස් වෙනි මාසය මාස පහක් සභාවට ආදායමකුත් නෑ කරන කෙනාට කරන්නත් නැහැ. මේක අලුත් වැඩියා කරනව නම් හොඳයි නගරාධිපති තුමනි දැනට ගේට්ටුව වහලා තියෙන්නේ.

**<u>ගරු නගරාධිපතිතුමා</u>**

මන්ත්‍රීතුමා දැන් මේක ඇතුලේ අලුත්වැඩියා කටයුතු කරගෙන යනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමා.</u>**

ගරු නගරාධිපතිතුමා මං අදහස් කීපයක් ප්‍රකාශ කරනවා මේ අවස්ථාවේ දී. දැන් අපේ මේ ආර්.ඩී එක වටරවුම් ටික ඒගොල්ලො ගත්තා. ඔබතුමා දකිනවා ඇති ගොඩක් රිය අනතුරු සිද්ධවෙනවා. වටරවුම් නැති තැන්වල. පාරවලුත් එහෙමයි. හැබැයි එකේ පාරවල් නොවේ තම පාරවල් සහ පළාත් සභා පාරවල් උදාහරණයක් විදිහට ගත්තොත් මයිලගස් හන්දිය, ශ්‍රීමත් මාවත ,ඩී.එස්.සේනානායක ඉස්කෝලේ ළඟ තියන හතරමං හන්දිය හේතුව පුදුම විදිහට දෛනිකව විශාල අනතුරු සංඛ්‍යාවක් සිද්ධ වෙනවා. එනිසා p r d එකක් ගෙන්න ගෙන නගර සභාවේ මේ ස්ථාන ටික හඳුනා ගෙන මේ තැන්වල මොකක් හරි මංසන්ධි වල අනතුරු වළක්වන, සුදුසු ක්‍රමයකට වටරවුම නැවත සලකුණු කරන එක හොඳයි කියලා මම මේ අවස්ථාවේදී යෝජනා කර සිටිනවා.

අනිත් එක තමයි ගරු නගරාධිපතිතුමනි, මේ වන විට නගරයේ ආරක්ෂාව පිරිහිලා තියනවා. මේ රටෙත් ආරක්ෂාව පිරිහිලා යනවා නේ. පාතාල ලෝකය වැඩි වෙනවා . කුඩු වැඩිවෙලා තියෙනවා. මේ කියන සියලුම දේවල් අනුරාධපුර වැඩිවෙනවා. ප්‍රධාන පාරේ අතුරු පාරවල්වල ටියුෂන් ක්ලාස් තියෙන තැන් වල උදේට මේ ගැන අහන්න පුළුවන් මේ නගර සභාවේ කුණු එකතු කරන අයගෙන්. පුදුම විදිහට මත්ද්‍රව්‍ය වෙනුවට භාවිතා කරන විකල්ප ඖෂධ වර්ග කඩවල් වල තියෙනවා. අර බෝතල් , පෙති පැකට් ටොපී ගොඩගැහිලා දැන් ඒව තමයි මත්ද්‍රව්‍ය විදිහට ශිෂ්‍යයන් පාවිච්චි කරන්නේ. මේ නගර සභාව ඉස්සරහ තියන බස්ටෑන්ඩ් එක ළඟටත් නිතරම පොලිසියෙන් පයිනවා. පුස්තකාලය ගේට්ටුව ළඟ ඉතින් ඒත් අපි දකින්නේ නෑ පොලිසිය කොහොම ක්‍රියාත්මක වෙනවද කියලා . අර කුම්බිච්චන්කුලම වැව වටේටම මේවා භාවිතා වෙනවා. අර ඊසි කෑෂ් ක්‍රමයට මුදල් ගණුදෙනු කරලා මේවා ව්‍යාප්ත වෙලා තියෙනවා. දැන් ඉස්සර වගේ නිශ්චිත තැන් නැහැ. දැන් සල්ලි ඊසි කෑෂ් කරහම ඒ වෙලාවට තැනකට ගිහිල්ලා දානවා. ඉතිං වෙලාවකට මේ පොලිසිය බෝඩ් එක ළඟ තියලා තියෙනවා. ඒ වගේ මේ උපක්‍රම එගොල්ලෝ වෙනස් කර ගෙන තියෙනවා. මේ පිළිබඳ විශේෂ රැස්වීමක් ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් හැකි ඉක්මනින් තියන්න ඕනේ. ආරක්ෂාව පිළිබඳව මොනවද අරන් තියෙන ක්‍රියාමාර්ග ඇත්තටම අර ඉස්සර රාත්‍රී ජංගම මුර සේවා පොලිසියේ නිලධාරින් යනවා. ඒව දැන් බොහොම අකර්මණ්‍ය වෙලා තියෙන්නේ.

මේ නගරයට, ව්‍යාපාරිකයන්ගේ ආරක්ෂාව නගරයට එන ශිෂ්‍යයන්ගේ ආරක්ෂාව වගේම මහ ජනතාවගේ ආරක්ෂාවට ඉක්මනින්ම මේ සම්බන්ධීකරණ කමිටුව කැඳවලා කටයුතු කරමු කියලා. එවගේම ඔබතුමා උත්සාහයක දරුවා මේ නගරයේ ගුරුවරු ගෙනල්ලා සාකච්ඡාවක් පවත්වන්න . උදේ එළිවෙද්දි ටියුෂන් ගුරුවරුන්ගේ කෙනෙක්ගේ පෝස්ටර් උඩ තව එක්කෙනෙක් ඒ පෝස්ටර් නගරයේ සියලුම ස්ථානවල. මේවා අලවනවා මාර්ගය පෙන්වන බෝඩ් එකේ ඉඳලා වහලා දාලා තියෙන්නේ ඒනිසා ඔබතුමා උත්සාහයක් දැරුවා මේ ටියුෂන් ගුරුවරු ගෙන්නන්න. මම හිතන්නේ මේක ටියුෂන් ගුරුවරුන්ට වඩා ගුරුවරුන් නම් සංචාරකයෝ වගේ ගාල්ල මාතර නුවර කුරුණෑගල ප්‍රදේශවලින් එන්නේ ඒ නිසා අපට ගෙන්නන්න තියෙන්නේ මධ්‍යස්ථානයේ අයිතිකාරයව. ගොඩනැගිලි හිමිකරුවා තමයි ගෙන්නන්න ඕන.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

මේ මස විසි දෙවැනිදා අපි කැඳවීමක් කරලා තියෙනවා ගුරුවරු සහ ගොඩනැගිලි හිමිකාරයෝ සියලුදෙනාම.

**<u>ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමා.</u>**

මේ උපකාරක පන්ති පවත්ව ගොඩනැගිලි වල කිසිම සෞඛ්‍ය පහසුකමක් දීල නෑ ළමයි දාහ දෙදහා ක්ලාස් වල...

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

ඔබතුමාට මේ කියන්නේ අපි සැලසුම් කමිටුවේදී තීරණයක් ගත්තා , දැන් අපෙන් ගොඩනැගිලි තට්ටු දෙකට ගන්නවා අනුමැතියට. හතරක් හදාගන්නවා හදලා අවුරුද්දකින් විතර අපට අය ගෙනත් දෙනවා දඩ වලින් ඉවත් කරන්න කියලා. එක ඊළඟ අවුරුද්දේ අනිවාර්යෙන්ම වෙළඳ බලපත්‍රය හදලා තියන ඒවට විතරයි දැන් සමහර වෛද්‍ය මධ්‍යස්ථාන තියෙනවා තට්ටු දෙකට ගොඩනැගිල්ල අනුමත කරලා තට්ටු තුනට හතරට හරි ගස්සපු ඒවා.

<u>ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමා.</u>

ඒක වෙලා තියෙන්නේ භාවිත සැලැස්ම වෙනස් කරනවා අපට පෙන්වනවා ground floor එක පාක් එකක් විදිහට ඊට පස්සේ ඒවත් බිස්නස් වලට යොදා ගන්නවා.

<u>ගරු නගරාධිපතිතුමා.</u>

දැන් බලන්න රෝහලේ ඉස්සරහ හදන ගොඩනැගිල්ල. අපි කියලා තියෙනවා එක අනුමත කර ගන්න කියලා. ඒක අනුමත කර ගන්නෙත් නෑ දැනි හරි නම් අපි නඩු දාන්න ඕනේ ඉංජිනේරුවරයාට. ඒක අනුමත කර නොගෙන හදන එකට. කවුද වගකියන්නේ ඒක බිහිරි හොරොව්වව අයිනේ ම දන්නේ. මේවා රාජ්‍ය ආයතන. සමුපකාර ගොඩනැගිල්ල දැන් ඔබතුමාලා වැරදි මතයක් ගන්නේ. මම ඒක වහන්න හදනවා කියලා වැරදි වැඩක් කරනවා කියලා ඒ දවස්වල රු.4000.00 කුලිය දැනත් ලක්ෂ ගාණක් එකතු වුනා. ඊට පස්සේ කොමසාරිස්තුමාට විගණනයෙන් එතුමාගෙන් කරුණු විමසුවා. ඇයි අයින් කරන්න ඇත්තෙ කියලා. පස්සෙ අපි කිව්වා ඒ ගොල්ලන්ට මේක ගෙවන්න කියලා ඒගොල්ලො ගෙව්වට පස්සේ බද්ද අහෝසි කරා. දැන් ඒගොල්ලො ඇවිල්ලා අර ඉඩම හුවමාරු කර ගමු කියල කියනවා. නැත්නම් මම කිව්වා අනිවාර්යෙන් ගෙවන්න නැත්නම් එක නගර සභාවට පවරා ගන්න සිද්ධ වෙනවා කියලා. ඒ ගොඩනැගිල්ල අනුමත කරලත් නෑ කුලී ගෙවලත් නෑ ඒ අය හිතන්නේ දීර්ඝ කාලයක් හිටපු නිසා ඒ භුක්තිය මත එක පවර ගන්ඩ. පනත අනුව එක කරන්න බැහැ.

<u>ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමා.</u>

ගරු නගරාධිපතිතුමනි ඒ වගේම තවත් කාරණයක් තමයි කුම්බිච්චන්කුලම වැව පරිශ්‍රයේ සංවර්ධන වැඩ වලදී එය නිසි ප්‍රමිතියෙන් ඉෂ්ට වෙනවා ද නැද්ද කියන එක දැන් අපිට තියෙන නිරීක්ෂණය තමයි සාමාන්‍යයෙන් හයිකරලා තියෙන සූර්ය බල පැනල තියෙන්නේ. ඒවා රෑ 11, 12 වෙනකොට නිවෙනවා. අපි දන්නේ නෑ ටෙන්ඩර් කරලා තියෙන්නේ හොඳම එකට වෙන්න පුළුවන් හැබැයි හයි කරලා තියෙන්නේ ප්‍රමිතියෙන් බාල ඒවා වෙන්න පුවුවන්. එළිවෙනකල් තියෙන්න ඕනේ ආරක්ෂාව සම්බන්ධයෙන් 11 - 12 වෙනකොට ඒවා නිවෙනවා නම් වැඩක් නැනේ. මට ප්‍රදේශවාසීන්ගෙන් තමයි ඒ පැමිණිල්ලක කලේ. මං හිතන්නේ ඔබතුමාටත් කියන්න ඇති. ඔබතුමා එය පරික්ෂා කරන්න කියලා ලිඛිතව දන්වන්න. මේ සම්බන්ධයෙන් මේ ඇතුළේ විශාල මුදල් වංචාවක් සිද්ධ වෙලා තියෙනවා. ප්‍රමිතියකින් නැති ඒවා හයිකරලා තියෙනවා ඒ සම්බන්ධයෙන් අදාළ විමසීමේ නාගරික සංවර්ධන අධිකාරියෙන් කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ඊලඟ එක තමයි අපි දිගටම ඉල්ලීම් කරපු සිසිල උද්‍යානය ලබාගැනීම සම්බන්ධයෙනුත් මම ඔබතුමාට මතක් කර සිටිනවා. මේ ගරු සභාවේ දී. එ්ක සංවර්ධනය කිරීමෙන් අනතුරු අපිට ලබාදෙන පදනම මත තමයි ඒකෙ සැලසුම අනුමත කරලා තියෙන්නේ . නමුත් ඒක සිද්ධ වෙලත් . නෑ මහජන ක්‍රීඩාංගනය තත්ත්වයක් ඒකමයි මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කරලත් අපට දිය යුතුයි. අපේ ක්‍රීඩා භූමි පාලක වරයෙක් ඉන්නවා අපි වැටුප් ගෙවනවා . අපට සම්පත් තියෙනවා සේවකයෝ ඉන්නවා. නමුත් අපිට ලබා දෙන්න ඇතුව දිගින් දිගටම යනවා. මම හිතන්නේ මෙන්න මේ කාරණා අපි මූලිකව සමුපකාර රෝහල සහ මහජන ක්‍රීඩාංගණය කියන මේ අපේ සභා වත්කම් අපට ලබාගන්න කටයුතු කළ යුතුයි. හේතුව එන්න එන්නම නගරයේ ජනගහනය ඉහළ යනවා දැන් ලක්ෂ 8 කටත් වැඩියි තව අවුරුදු දහයක් විතර යද්දි මේක දෙගුණයක් වෙයි. එතකොට එන්න එන්න මේ සභාව ගෙනි යන්න සල්ලි එන තැනක් නැහැ. ආණ්ඩුවෙන් දෙන්නෙත් නැහැ.

පළාත් සභාවෙන් දෙන්නෙත් නැහැ. ආදායම හොයාගන්න තියෙන තැන් ටික පහුගිය අවුරුදු පහේදි විශාල ප්‍රමාණයක් වැඩි කරලා දුන්නා. කෝටි 13ක් විතර තිබ්බ එක කෝටි හැට හැත්තෑවක් පමණ වැඩි කර ගත්තා. ඔබතුමා ආදායම් උත්පාදන ක්‍රමවේද හැදුවා හැබැයි ඒවා හදනවා වගේම මේ අපේ මේ ආදායම් ගන්න තියෙන තැන් ටික නැති වුනොත් ඉස්සරහට අපිට මේ පුරවැසියන්ගේ අවශ්‍යතා ඉෂ්ට කරන්න අපහසු වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වගේම මේක ආයතනයක් විදිහට ගත්තාම මෙකේ සේවාව සපයන කොට තියෙනවා දුර්වල තැන් විශේෂයෙන් කියන්න ඕනේ සෞඛ්‍ය අංශයේ සහ ඉංජිනේරු අංශය නම් හොඳට කටයුතු කරනවා. ඒගොල්ලෝ ඒ ගොල්ලන්ගෙ සේවය හොඳ තත්ත්වයකින් පවත්වාගෙන යනවා. නමුත් අපිට පේනවා. අපේ නගර සභාවේ මේ ආයතන අංශය සහා කටයුතු වල ප්‍රගතිය සොයා බැලීමේ දී මෙන්ම කාර්යාල කටයුතු සම්බන්ධීකරණය කිරීමේ දී පැහැදිලි දුර්වලතාවයක් තියෙනවා. ඒ නිසා මම යෝජනාවක් විදිහට කියන්න කැමතියි අපි මේක සභා ලේකම් දෙපාර්තමේන්තුවක් ලෙස නව දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කරල කටයුතු කිරීම හොඳයි. එතකොට අපිට වැඩ වල බාධාවක් ඇති වෙන්නේ නැතිවෙයි. වැඩ වැඩියි ඇත්තටම මේ නගර සභාවේ. වෙනත් කාර්යාල වල පරිපාලන නිලධාරියෙක්ට තියෙන්නේ උපරිම තිහක් තිස්පහක් පමණ කාර්යමණ්ඩලයක් තමයි බලන්න. නමුත් අපේ 660 - 650ක් පමණ සේවකයන්ගේ කටයුතු බලන්ඩ තියෙනවා පරිපාලන නිලධාරී තුමන්ට. එනිසා මම හිතනවා සභා කාර්යයන් සඳහා නව දෙපාර්තමේන්තුවක් අපි බිහි කර ගත්තොත් මම හිතනවා මේ ගැටලුව නිරාකරණය වෙයි කියලා.

අනිත් එක තමයි අපෙන් සේවාවක් ලබා ගන්න එන පුරවැසියන්ට අපි දෙන සේවාව ප්‍රමාණවත් නැහැ . ඒ නිසා එන පුරවැසියන්ට ගෞරවාන්විත සේවාවක් සපයලා ඒ අයව මෙතනින් එලියට යවන්න අවශ්‍ය පියවර සහ පහසුකම් ලබාදිය යුතුයි කියන එක මම යෝජනා කර සිටිනවා.

ඒවගේම අපේ කමිටු වාර්තා වල දාලා තියනවා සුදුසු ආපන ශාලාවක් අපේ නගර සභාවටවත් අඩුම ගානේ තියෙන්න ඕනේ. ඉස්සරලම හරිනං අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්තුරු අල්ලන්න ඕනෙ අපේ කැන්ටීම. ඉතින් මම බලාපොරොත්තු වෙන ඉතාමත් කඩිනමින් ඒ කමිටුවේ යෝජනා කරලා තියෙන ආපන ශාලාව නව ස්ථානයක ස්ථාපිත කිරීමට කටයුතු කරයි කියලා.

ඒ වගේම අපේ අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ගැනීම සඳහා ලබා දීපු පහසුකම් යටතේ අපි ඒ කාර්යය ඉතාමත් කඩිනමින් කරගෙන යනවා. මම හිතනවා දෙසැම්බර් මාසය වෙද්දි අපිට මහා නගර සභාව මගින් බලාත්මක කරන්න පුළුවන් අතුරු ව්‍යවස්ථා හදලා ඒක අවසාන කරගන්න පුළුවන්වෙයි කියලා. බොහොම ස්තූතියි.

<u>ගරු නාගරික මන්ත්‍රී නීතිඥ නිර්මලී ප්‍රියදර්ශනී මැතිතුමිය.</u>

ගරු නගරාධිපතිතුමානි, නලින් මන්ත්‍රීතුමා කිව්වා වගේ නගරයේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශාල ගැටලුවක් පවතිනවා. විශේෂයෙන් ඇවිදින මංතීරුවල පසුගිය දිනක නුවර වැව ඇවිදින මංතීරුවේ ගිය කෙනෙක් ගේ මාලයක් කඩලා තිබුණා. මේ වගේ සංචාරකයන්ට නිදහසේ ඉන්න බැරි තත්වයක් තියෙනවා ගරු නගරාධිපති තුමනි, මේ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙච්ච පිරිස ඒ අයට විවිධ බලපෑම් කරනවා කියලා දැනගන්න තියෙනවා. මම යෝජනාවක් ගේනවා නගරාධිපති තුමනි පොලිසිය හෝ වෙනත් ආරක්ෂක අංශයක් යොදාගෙන මේ තත්ත්වය මැඩ පවත්වන්න යම්කිසි කාලයක් අරගෙන ඔබ කටයුතු කරයි කියලා.

<u>ගරු නාගරික මන්ත්‍රී ඉන්දික අරුණ කුමාර මැතිතුමා</u>

ගරු නගරාධිපති තුමනි මේ දිනවල වතුර හිඟයකට නගර සභා සීමාව තුළ ජනතාව පත්වෙලා තියෙනවා කෙසේ වෙතත් මම ඉල්ලීමක් කරන්න කැමැතියි නගර සීමාව තුල තියෙන පොදු ළිං ටික සුද්ද කරලා පොදුවේ ඒ ඒ ප්‍රදේශවල ජනතාවට පරිහරණය කරන්න පුළුවන් විදිහට වැඩපිළිවෙළක් හදන්න කියලා. විශේෂයෙන්ම අපිට විශ්වාසයක් නෑ අපිට වැස්ස ඉදිරියේදී ලැබෙයිද කියලා. විශේෂයෙන් තුරුවිල, නුවර වැව යන ජලමූලාශ්‍රයන් වල සීග්‍ර ජලය අඩු වීමක් පවතින ඒ නිසා පානීය ජලය කෙසේ වෙතත් පාවිච්චි කිරීම සඳහා ළිං ටික සුද්ද කරලා එ් අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වගේම ගරු නගරාධිපති තුමනි ඔබතුමා කතා කරා මාර්ග තදබදය සම්බන්ධව. විශේෂයෙන්ම සේවා මාර්ග වල බැංකු වවුමේ තියෙන සේවා මාර්ග ටික හදල දුන්නොත් හොඳයි කියලා මගේ අදහසයි.

වරිපනම් ගෙවන අයට ඒක ක්‍රමවත්ව සකස් කරල දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. පහුගිය දවස් වල ඒ වරිපණම් ගෙව්වත් අදාල ලේඛනයේ පරිගණකයේ අඩුවෙන් නැතුව තිබුන ප්‍රශ්ණ තියෙනවා. මම දන්න තරමින් අවස්ථා දෙකක් පැමිණිලි කරලා තියනවා. ගණකාධිකාරිවරයා තොරතු පරික්ෂා කරල දෙන්නම් කියල ඒවා පිළිබඳ මිනිසුන්ගේ තියෙන්නෙ අපැහැදිලිතාවයන්.

ඒවගේම මාර්ග ඉන්වෙන්ට්‍රිය සම්බන්ධව මුදල් කාරක සභාවේ තියෙනවා අපේ දේපළ සම්බන්ධයෙන් ඉන්වෙන්ට්‍රිය සකස් කළොත් හොඳයි කියලා මම ප්‍රකාශ කර සිටිනවා. අපේ දේපළ අවභාවිතා වෙනවා වෙනත් අය භාවිතා කරනවා. ඔය සමුපකාර රෝහලත් එහෙමයි මම විශේෂ ඉල්ලීමක් කරනවා නිලධාරියෙක් යොදවලා අප සතු දේපළ පිළිබඳ ඉන්වෙන්ට්‍රියක් සකස් කරලා අවශ්‍ය කටයුතු කරන්න කියලා.

අනික ගරු නගරාධිපතිතුමානි, ස්වභා උද්‍යානය පිළිබඳව එක යෝජනාවක් ඇවිල්ලා තියනවා. දියත උද්‍යානයක් බවට පත් කරන්න. ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී සාකච්ඡාවක් පවත්වලා අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා . බොහොම ස්තූතියි.

<u>ගරු නාගරික මන්ත්‍රී නදීර ප්‍රභාත් ධර්මදාස මැතිතුමා.</u>

ගරු නගරාධිපතිතුමනි, ඔය වත්කම් සම්බන්ධ කරපු ප්‍රකාශය. ඒ සම්බන්ධව පළාත් භාණ්ඩාගාර හරහා හඳුන්වලා දීලා තියෙනවා සිස්ටම් එකක්. එක ස්තාපිත කරලා ඒ හරහා සියලුම වත්කම් පිළිබඳ දත්ත ඇතුලත් කිරීම සුදුසුයි කියලා යෝජනා කරනවා.

<u>ගරු නාගරික මන්ත්‍රී නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා.</u>

ගරු නගරාධිපති තුමනි අද අපට කරුණු කාරණා කිහිපයක් මතුවුනා විශේෂයෙන් පදික වෙළඳසැල් වෙළඳාම් සම්බන්ධව. පදික

වෙළඳම කියලා දැන් ස්ථාවර කණ්ඩායමක් ඉන්නවා. ඒ අයගෙන් අපිට ආදායම් මාර්ගයකුත් තියෙනවා. තවත් ආදායම් මාර්ග නිශ්චිත කරගන්න පුළුවන් ඊට විසඳුම් වශයෙන් යෝජනා කළා පදික වළඳසැල් එක තැනකට ගේන්න. නමුත් පදික වෙළෙන්දාගේ වෙළඳාම එක තැනකට එකතු කරලා කරන වෙළදාම කියලා විශ්වාස කරන්න හොඳ නෑ. මහා මාර්ගය පරිහරණය කරන මිනිස්සු යන එන ගමන් ගෙදර යන ගමන් භාණ්ඩ මිලදී ගන්න ක්‍රමය තමයි පදික වෙළදාම කියලා කියන්නේ. මිනිස්සු එන්නේ නෑ ඔය කොහේ හරි තිබුණා කියලා. ඒ නිසා නගරයේ රැස්වෙනවා පොලිසිය හා දිසාපතිතුමා එකතුවෙලා මාර්ග ආරක්ෂණ කමිටුවක් කියලා එකක්. ඔය කමිටුව තමයි මේකෙ පාලනය බලය තියෙන්නේ මහ නගර සභා පනත අනුව බලය තියෙන්නෙ අපට. නමුත් අපි ප්‍රධානත්වයෙන් හෝ අපේ කමිටුවේ ප්‍රධානත්වයෙන් හෝ රථවාහන කමිටුව පැවැත් වියයුතුයි. නගරයක දැන්වීමක් උනත් අණ පරිදි නාගරික කොමසාරිස් කියලා ඒකයි තියෙන්නේ. පොලිසියට අයිති වැඩක් නෙවෙයි මේක. වැරදි පැත්තට ගිහින් ඒ නිසා මේ පරිපාලනය සම්පූර්ණයෙන් අපට ගන්න ඕනේ.

ඒ වගේම තමා වටරවුම් සහ පාරවල් මහා නගර සභා ආඥා පනත සහ මහා මාර්ග ආඥා පනත අනුව පැහැදිලිව අර්ථ නිරූපණය කරලා තියෙනවා මහ නගර සභාව තුළ ඒව මහා නගර සභාවට හිමි. දැන් කොළඹ මහා නගර සභාවේ වැල්ලවත්ත පාලම ළඟට යනකල් මාර්ග අයිති වෙන්නේ කොළඹ මහ නගර සභාවට. අපට සල්ලි නෑ කියලා මේවා අපි අත ඇරියෙ. දැන් ඒ ගොල්ලෝ එවැනි ආදායමක් ගන්නවා. මේ නගරයේ පුරවැසියන්ට අසාධාරණයක් වෙන්න දෙන්න හොඳ නෑ. අනවශ්‍ය විදිහට සල්ලි අය කරලා ඔය බෝඩ් වලට ඒගොල්ලන්ට කරන්න දෙන්න එපා. අපි අය කරන්න ඕනේ.

උදාහරණයක් ගන්නකෝ , සිංහ කණුව වටරවුම. ඒක අපේ නගරයේ තියෙන මුල්ගල. මේ නගරයේ මුල් ගල තමයි සිංහ කණුව කියන්නේ. එතකොට ඒ වටරවුම විතරක් අපේ වෙන්නේ කොහොමද. එනිසා ඔය සියලුම වටරවුම් අපේ විය යුතුයි. පාරවල් අපේ විය යුතුයි. ඩී.එස්. සේනානායක මාවතත් ඒ ගොඩේ තියෙන්නෙ. ඒකත් මහින්ද මහත්තයාට කොලේ වහලා ගහපු අස්සනේ. 2005 ඔක්තෝම්බර් 10 ජනාධිපති තුමා පත් වුණේ. ඔක්තෝබර් 8 වැනිදා විසුරුවලා තියෙන වෙලාවෙදි , ඡන්ද තියෙන වෙලාවෙදි මහා මාර්ග ඇමැති වශයෙන් අසන් දාලා ලියුමක් එවලා මේ ජනාධිපති විසින් කරා කියලා. අර දිනේ බලලා මං අහන කොට තමයි නිලධාරීන්ට පෙවුනේ. ඒක ජනාධිපති නෙමෙයි. මහා මාර්ග ඇමති එවල තියෙන්නෙ කියලා බොරුවට මේ ගොල්ලෝ පෙන්නනවා. ඉතින් ඒ නිසා මේ පිළිබඳ අවධානයට ලක් කරන්න. යූ.ඩී එක ඒකට අදාළව සංවර්ධනය කරනයා, අධ්‍යාපනයට අදාළව සංවර්ධනය කරනවා. සෞඛ්‍ය එකෙනුත් එහෙමයි. වාරිමාර්ග එකෙනුත් එහෙමයි. දැන් අපි හිතමු දුමින්ද දිසානායක ඇමතිතුමා ප්‍රතිපාද එවලා තියෙන්නේ පාරවල් දෙකක් හදන්න. දැන් එයාගේ අමාත්‍යංශ යටතේ අපට සල්ලි දීලා තියෙනවා. ඉතින් ඒ නිසා එක් එක් කෙනාට අයිති නෑ. ඒ වැඩේ අපට සල්ලි නෑ රාජ්‍ය ආයතන වල ලොකු වගකීමක් තියෙනවා රජයේ ප්‍රතිපාදන අපට දෙන්න. දුන්නට පස්සේ ඒගොල්ලන්ට කතා කරන්න දෙයක්නෑ. දැක්කනේ අර පොසොන් වෙළඳසැල් ටික ඒ ගොල්ලො ගන්න ගියා ඒක අපි නැවැත්තුවා. බොරු බැඳීමක් ඇති කරගන්න ඕනේ නෑ. ඉතින් ඒ නිසා ඒකත් පැහැදිලි කර ගන්න.

අනිත් එක තමයි අර කමිටු ගැන කිව්වා. කමිටු වලට පත් වෙන්න මේක නීතියෙන් පත්වෙන්න ඕනේ. අර පනතේ වගන්තිය අනුකූලව හරියට පත් කරා නම් අපි කොහොමත් පත්වෙනවා. එහෙම උනානම් ඔය කමිටු තුනකට හරි සභාපතිධූරයවත් අපට තියෙනවා. මම ඕන්නම් කරල පෙන්නන්න මේක. පනතට උඩින් යන්න බැහැ කාටවත්. අපිට දාහතර දෙනෙක් ඉන්නවා ඒ දාහතර දෙනාගෙන් කමිටු හදන්න පුළුවන්. අවශේෂ කරන්න බෑ. එදා හතරදෙනාත් මන්ත්‍රීවරු.

ඊළඟ කරුණ නගරයේ වැදගත් ස්ථාන ප්‍රමිතිකරණය කරන්න මිනින්දෝරු කටයුතු සිද්ධ කරන එකක් තියෙනවා එක ඔබතුමා පස්සෙ පැහැදිලි කිරීමක් කරානම් හොඳයි මන්ත්‍රීවරුන්ට. ඊළඟට තමයි අර දේපළ ලේඛනය මේක නිවැරැදිව නිරවුල් කරන්න කියලා. ඉඩම් තියෙනවා, ground තියෙනව, ප්‍රජාශාලා තියෙනවා නමුත් එකකවත් ලේඛනයක් නෑ. මේක අනිවාර්යෙන්ම කෙළවරකින් පටන් ගන්න. කොන්දේසි ගැන බලන්න. ඒ නිසා ඉක්මනින්ම මේවා මේ ලේඛනගත කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. අපි ඉස්සර වුණා නම් මේ ඇතිවෙලා තියෙන ගැටළු ඇතිවෙන්නේ නැහැ. මේ සඳහා නිලධාරියකු යොමු කරන්න.

එක තමයි අර පදිකයන් සම්බන්ධයෙන් මේ RD 1 කරපු එක මාර්ග වලට අවහිර වෙනවා කියලා පට්ටපල් බොරුවක්. සමහර තැන් වල කලේ ඒ අර වාහන නවත්තලා ලොකු බ්ලොක් එකක් වෙලා ඇත්තෙත් නෑ බලන්න නිවත්තකචේතිය පාර . එයාලගේ මානසික ප්‍රශ්න තියෙන්නේ මුළු ලෝකෙම පේමන්ට් බිස්නස් එකක් තියෙනවා.

දැන් ඔබතුමාට මම එදා ඉදල කිව්වනේ මේ ඉස්පිරිතාලෙ අඩි 70 ක් විතර ප්‍රමාණයක් එක් කෙනෙක් අල්ලන් ඉන්නවා. මේකෙ තියෙන්නෙ අරමුණු දෙකයි. මොකද්ද එකක් තව මනුස්සයෙකුට එන්න තියන අවස්ථාව නැති කරන්න. අනිත් එක තමයි තව මිනිහෙක් ආවොත් එහෙම ගානක් අහලා විකුණන්න. ඕක තමයි හැමතැනම වෙලා තියෙන්නේ. පොලේ වෙලා තියෙන්නේ.. ඕක අඩි 10 වෙන්කරලා අංකයක් දෙන්න කෝ. එතකොට හවසට calculation කරන කොට ආදායම නිකම්ම ගන්න පුළුවන් මොකද අවුරුද්දටම විකුණන්න බඩු ගෙන්නේ නෑනේ.

අර හොස්පිටල් එක ඉස්සරහා පදික වෙළඳ සැල් අඩි 10 - 10 වෙන් කරලා මම කීපාරක් ඉරි ගැස්සු වද ක්‍රියාත්මක කරන්න. මේ කිසි ප්‍රශ්නයක් නෑ. අනිත් එක තමා ඒ මිනිස්සුන්ගේ ජීවන උපාය මාර්ගයට අපි මොකුත් අගතියක් කරන්න හොඳ නෑ. අනිත් එක තමා වලේ කඩේ මෙතනම වෙන් කර ගෙන ඉන්නවා. වෙන තැනක ගිහිල්ලා වෙළඳාම් කරනව. මෙතන මම කිව්වා ඇත්ත ඉන්න ගාන ගණන් කරන්න කියල. අනිත් අය අයින් කරන්න කියලා. ඊළඟ තමයි යන මාර්ගයට බොක්ක වගේ හැදුවනම් ඔය ඉන්න මිනිස්සුන්ට ඔක්කෝටම වෙළඳාමක් සිද්ධ වෙනවා. හැමවෙලේම ඇස් බැල්මට ප්‍රවේශයක් ඉදිවෙලා තියෙන්නේ නැත්නම් ඒ මිනිස්සුන්ට විසඳුමක් දෙන්න ඕන හැමදාම අපේ පස්සෙන් එනවා. මේ නගර සභාවටම එක පොතයි තියෙන්නෙ. මේ මුදල් අය කිරීම සම්බන්ධව මං ඒ පොත නීති නිලධාරීන්ට දුන්නා. පරිස්සම් කරලා තියන්න කියලා. ඉතින් ඒ නිසා මේ ගැන අවධානයට ලක් කරන්න කියලා ඉල්ලීමක් කරනවා ස්තුතියි.

**<u>ගරු නාගරික මන්ත්‍රී දුමිඳු දයාසෙන් රැටියල මැතිතුමා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපි සභාවේ කමිටු පත් කරලා එම කමිටු මගින් ගත් ක්‍රියාමාර්ගයක් හැටියට සුසිල් මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ සෞඛ්‍ය අංශය හා සියලු කාර්ය මණ්ඩලය එකතුවෙලා ශ්‍රමදාන වැඩ සටහනක් ක්‍රීයාත්මක කරා. ඒ වැඩසටහන කොට්ඨාශ වශයෙන් ක්‍රියාත්මක වෙනවා. බුද්ධගයා මාවත ප්‍රදේශ ඊළඟ වැඩසටහන ක්‍රියාත්මක වෙනවා. ඒ තුළ බුද්ධගයා මාවත අද දින ආරම්භ කරලා තියෙනවා කානු පද්ධතිය සියල්ල පිළිසකර කිරීම. ඒ වගේම වැසි ජලය නැති නිසා පානීය ජල මූලාශ්‍ර පවිත්‍ර කර භාවිතය. එහි ජලය භාවිතයට ගැනීමට හැකි වන පරිදි පිරිසිදු කටයුතු සිදු කිරීම ක්‍රියාත්මක වෙනවා වගේම ගරු නගරාධිපතිතුමනි, ඒක කොටස් වශයෙන් මුළු නගර සීමාවතුළම කිරීමට නියමිතයි. සෞඛ්‍ය ප්‍රශ්න විශේෂයෙන් නගර සභාවේ වෛද්‍යවරයා එකතු කරගෙන වෛද්‍ය සායන පවත්වා ගෙන යාමට අප කටයුතු කරනවා. කොට්ඨාශ වශයෙන් ඒවගේම කාණු පද්ධති පිළිබඳ ප්‍රශ්න විසඳනවා කාණු බ්ලොක් කරලා තියෙන තැන් පිරිසිදු කිරීම් කටයුතු කරනවා.

ඒ වගේම ගරු නගරාධිපතිතුමාගේ පහුගිය සභාවේ දී මම කිව්වා ක්‍රීඩා පිට්ටනියේ මැනුම් කටයුතු කරන්න කියලා යෝජනාවක් ගෙනාවා. සියලු පිට්ටනි විශාල ප්‍රමාණයක් තියෙනවා. ඒවා මැනුම් කටයුතු කරලා බලපත්‍රයක් ලබා දීලා ඒ පිළිබඳ තහවුරු කරන්න කියලා යෝජනාවක් කරනවා.
ඒ වගේම ගෙවල් 60 ප්‍රදේශයේ සම්පූර්ණයෙන්ම යන්න බෑ. 253 තුලානේ පාරවල් නිසි අයුරින් මැනුම්කරණයට ලක් කරල කටයුතු කරන්න කියලා යෝජනා කරනවා. එවකට මැනුම් කරන කටයුතු කරපු නිලධාරියාට මුදල් ගෙවීම් කරලා තිබ්බේ නෑ. මැනුම් කටයුතු වල ඉදිරි කටයුතු කරන්න කියලා මම තුමාට යෝජනා කරනවා. ඒ වගේම අපි ස්තුතිවන්ත වෙනවා නගර සභාවක් විදිහට අපි කරන වැඩ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව කමිටුවලින් පටන් අරන් තියෙනවා. සභාවට කියා සිටින්න ඕන අපි අත්තිවාරම දාලා තියෙනවා ක්‍රීඩා කමිටුවේ අපි ඉදිරියට ක්‍රියාත්මක කරනවා.. විශේෂයෙන් ස්වභා උයන කමිටු තීරණයක් මත වැහුවා. හැබැයි ඒක කඩිනමින් විවෘත කරන්න කියල මමයි මතක් කරනවා. මේක අවුරුදු ගානක් තිස්සේ අවභාවිත වෙච්ච තැනක් විදියට තියෙන්නේ ඒනිසා මේකට යම්කිසි සේවක සංඛ්‍යාවක් දාලා නැවත ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඉදිරියේදී ඔබතුමාලට දැනුම්දෙන්නම් 253 තුලානේ කාණු ටික සුද්දකරන්න පටන් ගන්නවා. ඒ වගේම ශ්‍රමදානයක් පටන් ගන්නවා. ඒ සඳහා සියලු දෙනාගේම සහභාගීත්වය බලාපොරොත්තුවෙන් මම මේ අවස්ථාවේදී නිහඬ නම් බොහොම ස්තූතියි.

**<u>ගරු නාගරික මන්ත්‍රී සුපුනි සඳමාලි මැතිතුමිය</u>**

ගරු නගරාධිපතිතුමනි, ශ්‍රී මහා බෝධි පටුමග ජනතාව අප්‍රසාදයක් පලකරලා තියෙනවා. නගර සභාව සම්බන්ධයෙන් මේ විදුලි අංශය නිසා. මොකද ඔවුන් රාත්‍රියේදී සමහර දවස්වල අළුයම වෙන්නත් ප්‍රථම වීථි පහන් නිවා දමනවා කියලා චෝදනාවක් තියෙනවා. මොකද අර දුම්රිය ස්ථානයට මිනිස්සු වැඩිපුර එතනින් යන හින්දා මිනිස්සුන්ට ඒක දැනෙනවා ඒ පිළිබඳව නගරාධිපතිතුමාව දැනුවත් කරන්න කියල කට්ටිය කියනවා.

ඊළඟ කාරණේ තමයි මම 6/28 වැනිදා විදුලි අංශයට ඔබතුමාගේ නිර්දේශ සහිතව ලිපියක් භාර දෙනවා. නුවරවැව කොට්ඨාසය ස්ථාන කීපයකට විදුලි පහන් සවි කරන්න කියලා. මේ පිළිබඳව මේ වෙනකන් කිසිම කටයුත්තක් වෙලා නෑ. ගරු නගරාධිපති තුමනි ඒ පිළිබඳව ඔබතුමාගේ දැඩි අවධානය යොමු කර ඉක්මනින් එම කටයුතු කරල දෙන්න කියල. මම ඉල්ලීමක් කරනවා. ඒ වගේම තමයි මම නගර සභාවේ තුන්වැනි සැසිවාරයේදී සභාවට යෝජනාවක් ගෙනාවා. ඔබතුමන්ට මගේ ප්‍රදේශයේ ජීවත්වෙන වැන්දඹු කාන්තාවකට ගෙයක් හදන වැඩසටහනේදී ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීම කරන්නේ චාරිකාවක් කර බලන්න මෙම තැනැත්තිය මේ වෙනකොට මුහුණ පාලා තියෙන තත්වය මොකක්ද කියලා. මොකද ඉදිරියේදී වර්ෂාව වෙන්න පුළුවන් ඇත්තටම ඔවුන්ට ජල පහසුකම් විදුලි පහසුකම් නෑ. උයාගෙන කන්න තැනක්වත් නෑ. මේ ලඟදිත් ඇවිල්ලා ඉල්ලීමක් කරා ඒක කරල දෙන්න කියලා අපි සභා අරමුදලින් ඍජු ශ්‍රම යටතේ මේ කාර්ය කරන්න තමයි ස්ථිර වුණේ. අපි සභාවේ විවිධ වැඩ කටයුතු කරනවා. එය කරන අතරට මේකත් එකතු කර හැකි ඉක්මනින් කරන්න කියලා ඉල්ලීමක් කරන ගමන් ගරු නගරාධිපති තුමනි තව ඉල්ලීමක් කරන්න තියෙනවා අපේ කමිටුවේ පරම යුතුකම වෙන්නේ නගරයේ දූ දරුවන් වෙනුවෙන් ඔවුන් පිළිබඳ යෝජන අදහස් හුවමාරු කරන එක. මේ පිළිබඳව ගරු සභාවට ලිඛිතව දැනුවත් කරන්නම්. මේ අවස්ථාවේ අදහස් ප්‍රකාශ කිරිමට ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී කේ.ඒ.ඉන්ද්‍රාණි මැතිතුමිය</u>**

ගරු නගරාධිපතිතුමා දිගින් දිගටම කතා කරා අද දින නලින් මන්ත්‍රීතුමාත් කතා කරා මේ නගරය දරුවෝ මත්ද්‍රව්‍ය උවදුරින් අද විනාශයට පත්වෙලා තියෙනවා. ඒනිසා ඔබතුමා පසුගිය සභා වාරයකදී යෝජනාවක් ගෙනාවා දහම් පාසල් දින වරුවක් හෝ අමතර පන්ති තහනම් කරන ලෙසට මම හිතන්නේ අද වෙනකම් වත් අපි ඒ පිළිබඳව දැනුවත්වෙලා නැහැ. ඒ සම්බන්ධව මොකද්ද ගත්ත ක්‍රියාමාර්ගය සම්බන්ධව.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

මේ සම්බන්ධයෙන් අපේ පුද්ගලිකව උපකාරක පන්තිවල ගුරුවරුන් සහ ගොඩනැගිලිහිමිකරුවන් කැඳවා සාකච්ඡාවක් පැවැති නමුත් හයදෙනයි ආවේ. අපි නැවත විසි දෙවැනිදා ඒ සම්බන්ධව සාකච්ඡා පවත්වන්න කටයුතු කරල තියෙනවා. එතනදී මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් කරන්න බලාපොරොත්තු වෙනවා.

**<u>ගරු නාගරික මන්ත්‍රී කේ.ඉන්ද්‍රානි මැතිතුමිය</u>**

ගරු නගරාධිපතිතුමා එවගේම තව යෝජනාවක් කරනවා. මේ සභාවේ දී අද කතා උනා පදික වෙළඳසැල් සම්බන්ධව. අනුරාධපුර පොදු වෙළඳසැල ස්ථානයේ ඉදලා මාතලේ හංදිය දක්වා දෙපැත්තේ ඉන්න පදික වෙළෙඳුන් අද රස්සාවක් නැතුව දෛනිකව සොයා ගන්න නැතුව ඔවුන් ඉතා අසරණ තත්ත්වයට පත්වෙලා ඉන්නවා. අර නාගරික සංවර්ධන අධිකාරිය ඔවුන්ගේ වෙළෙඳසල් කඩලා ඉවත් කරලා තියෙනවා. එම අයගෙන් අහල හරි ප්‍රමාණයක් දීලා හරි ඒ මිනිස්සුන්ට නැවත එයාලගේ රස්සාවල් කර ගන්න අවස්ථාව උදා කරලා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**<u>ගරු නගරාධිපතිතුමා.</u>**

ගරු මන්ත්‍රීතුමනි තුමියනි දන්නවද පොදු වෙළඳසලක් තියෙන කොට එතැනින් එහාට මීටර් 500 ක් යනකල් තවත් වෙළඳාම් කටයුතු කරන්න ඉඩ දෙන්න හැකියාවක් නැහැ කියලා. දැන් මේ market එකේ වෙළෙන්දෝ වතුර බිල් ගෙවනවා. ලයිට් බිල් ගෙවනවා, කඩ කුලී ගෙවනවා. ඒ දේවල් කුලී ගෙවා ගෙන තමා මේ වෙළඳ ව්‍යාපාර කටයුතු කරගෙන යන්නේ. ඒගොල්ලන්ගෙ ආදායම කඩා වැටිලා තියෙන්නේ.

පදික වෙළඳසැල් විධිමත් කරන ගමන් අර market එකේ වෙළෙන්දත් ආරක්ෂා කරගන්න ඕනේ. පාරේ කරවල විකුණන්නත් බෑ නේ. එළවළු විකුණන්නත් බැහැ. විෂබීජ සියලුම ඒවා එකතු වෙනවනේ. ලූණු පරිප්පු පදික වෙළඳසැලේ විකුණන්න බෑනේ ඒවාට වෙළඳපොලක් තියෙනවා. පලතුරක් දෙන්න බැහැ. ඉතා ඉක්මනින්ම විෂබීජ එන ආහාර පලතුරු කියන්නේ. ඉතින් මේකෙ මොනා හරි ප්‍රමිතියක් තියෙන්න ඕනේ .මේක අපි පොඩ්ඩ පොඩ්ඩ හරි විධිමත් කරන්න ඕනේ. ඉස්සර හිටියේ හතළිහයි. දැන් ඉන්නවා තුන්සිය ගානක්.. අපිට සුමානයක් විතර යන්න ඇරලා මේක විධිමත් කරමු.

**<u>නාගරික මන්ත්‍රී ඒ.කේ.ඉන්ද්‍රානි මැතිතුමිය.</u>**

ගරු නගරාධිපති තුමනි ජනතාව මාකට් එකට යන එක අඩුයි. Market එකේ තියෙන ඇපල් ගෙඩි දෙකක් දෙනවා රුපියල් සීයට නමුත් අර පදික වෙළෙඳාම ඇපල් තුනක් දෙනවා රුපියල් සීයට මිනිස්සු බලන්නේ ලාභය ගරු නගරාධිපතිතුමා.

ගරු නගරාධිපතිතුමා අනිත් එක තමයි අර පාසල් පිළිබඳව ඇති වෙලා තියන ගැටලුව. එතනදී ඒඅපේ ප්‍රදේශයේ ළඟම තියෙන පාසල මහින්ද පාසල නමුත් ඒ ආසන්නයේම ළමයි වුණත් එම විද්‍යාලයට අරන් නෑ. මේක ලොකු ගැටලුවක් ගරු නගරාධිපති තුමනි මේ පිළිබඳව සොයාබලා කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**<u>ගරු නියෝජ්‍ය නගරාධිපති තුමා</u>**

ගරු නගරාධිපතිතුමාගේ මම සභාව ආරම්භයේදීම ඔබතුමාට පෙත්සමක් ඉදිරිපත් කරා ඒ පිළිබඳව පරික්ෂා කර බලා කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. එහිදී මොනවාහරි හේතුවකින් ඒ පිළිබඳව කටයුතු කරන්න බැරිවෙලා තියෙනවා. මේ කඩේ

ඔප්පුව දීම සම්බන්ධව. ඒකෙන් ගාස්තු තක්සේරු ඔක්කොම ගෙවලා තියෙන්නේ නමුත් ඒ පැවරුම්කටයුතු මේ වනතුරු ඉටුවෙලා නැහැ. ඔබතුමා ඒ සඳහා අවශ්‍ය ඔප්පු ලබා දීමේ කටයුතු ඉටු කරන්න ඒ අදාළ නිලධාරීන් වන දැනුවත් කරන්න

ගරු නගරාධිපතිතුමනි , අනිත් කරුණ තමයි දැන් මේ නගරය විශාල වශයෙන් දරුවවන් මත්ද්‍රව්‍ය පාවිච්චියට ඇබ්බැහි වෙලා තියෙනවා. විශේෂයෙන්ම ප්‍රදේශයේ ප්‍රසිද්ධ පාසලක දරුවන් ද මේ සඳහා යොමු වෙලා තියනවා. මම මේ පිළිබඳව පාසලේ විදුහල්පතිතුමාගේ විමසීමක් කරා එතකොට විදුහල්පති තුමා කිව්වේ පාසලට ළමයි මත්ද්‍රව්‍ය ගෙනල්ලා ඒ ළමයිව පාසලෙන් අස් කරආ තියෙනවා කියලා. පොලිසියේ නිලධාරි මහත්මයාගේ පුතෙකුත් හම්බවෙලා ඒළමයත් අස් කරලා තියෙනන්නේ. ඒ නිලධාරි මහත්තයත් ඇඩුවා කියලා කිව්වා. මම කිව්වා කොහොම උනත් මේ හැම දෙයකට ම ගොදුරු වෙන්නේ අපේ නගරයේ දරුවන් කියලා . මේ පිළිබඳව විදුහල්පතිතුමා පහුවදා උදෑසන විද්‍යාලයේ රැස්වීමේදී කථා කරල තිබුනා. මෙම සිද්ධියක් වාර්තා වුණත් සමහර ගුරුවරු එපා කියන්නෙ නෑ ලු . එපා කියන්න ගිහාම ගුරුවරුන්ට තර්ජනය කරනවා ලු  කොහොමහරි අපි මේ ආරක්ෂක අංශ දැනුවත් කරලා හරි මේ මත්ද්‍රව්‍ය භීෂණයෙන් මේ අපේ බාල පරපුර බේරගන්න ඕනේ ඒක කරන්න ඕනේ.

එකක් අනිත් එක තමයි මේ පහුගිය කාලයේ  නගරයේ කඩ පහළොවක් හොරු කැඩුවා දැන් මේ නගරයට තියෙන ආරක්ෂාව දෙයියන්ගෙ පිහිටයි.  කිසිම ආරක්ෂක අංශයක රැකවරණයක් නෑ. මහා මාර්ගය කැමරා හයිකරලා තියෙනවා. අපි හිතුවා කැමරා හයි කරලා තිබ්බට පස්සේ මේවා අඩුවෙයි කියලා. මොකද මගේ වෙළෙඳසල් අවුරුදු 25ක් විතර තිබ්බේ තනි දොර ඒක හොරු කැඩුවෙ නෑ. දැන් යකඩ දොරවල් තුනක් ගහලා තියෙද්දී තමයි එ්ක කැඩුවේ. එ් ඇවිල්ල මගෙ අලාභය මුදල්වලින් රුපියල් එක්ලක්ෂ හතලිස් පන්දාහක් හා ෆොන්කාර්ඩ් සහ මගේ සේප්පුව කඩලා තිබ්බ ඔක්කොම ලාභය ලක්ෂ 5ක විතර වුණා නමුත් ඉන්ෂුවරන්ස් එක ඇවිල්ලා මට ලක්ෂ 10ක චෙක් එකක් දීලා තිබ්බා. මම ඒක ආපහුදුන්නා ඒ කියන්නේ නගරයේ බදු ගෙවන පුරවැසියන් ව්‍යාපාරිකයන් රජය විසි න්ආරක්ෂා කරන්න ඕන. මම හිතන්නේ මේ නගරයේ කෝටි ගණන් බදු ගෙවන ව්‍යාපාරිකයන්ඉන්නවා.... අපි ව්‍යාපාරිකයන් හැටියට අපිට වගකීමක් තියෙනවා රජයට බදු ගෙවන්න මට මේ ගෝල්ඩ් කාඩ් එකක් හම්බවෙලා තියෙනවා නිසි පරිදි බදු ගෙවීම සම්බන්ධව. නමුත් දැන් මට ඒ තත්ත්වයට යන්ඩ බෑ. ඒ  බැරි මොකද මාස දෙකහමාරක් තුළ මගේ සාප්පුව දෙපාරක් හොරු කැඩුවා.  දැන් ඒ කරලා ආපහු අලුතෙන් සේප්පුවක් ගෙනාවා . නමුත් පොලිසියෙන් ඇවිල්ල විභාග කරලා මට කිව්වා සති දෙකෙන් අල්ලල දෙන්නම් කියලා මාසයක් වුනා තාමත් නෑ. ඇල්ලුවත් වැඩක් නැනේ. දැන් ඒ අලාභය වෙලා ඉවරයි නේ. එ් නිසා මේ නගරයට යම් කිසි ආරක්ෂාවක් තියෙන්න ඕනේ.  මේක කමිටු හරහා හරි සාකච්චා කරලා අපි යම් කිසි ආරක්ෂාවක් මේ නගරයට සලසන්න වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනේ. මීට කලින් එ. ස්. පීසමරකෝන් මහතා ඉන්න කාලෙත් රාත්‍රියට හය දෙනෙක් විතර කණ්ඩායමක් දාලා රාත්‍රී මුර සංචාරයේ ආරක්ෂන අංශය යෙදෙව්වා.   ඒ කාලේ කඩයක් කැඩුවෙ නෑ. දැන් මම හිතන්නේ මේ කාලසීමාව තුල කඩ විස්සක් විතර හොරු කැඩුවා එනිසා අපිට දැන් මේ ආරක්ෂාව පිළිබඳව මොකක් හරි පියවරක් ගන්න ඕනේ . විශේෂයෙන් මම හිතන්නේ ව්‍යාපාරිකයන් ආරක්ෂා කරන්න ඕනේ . අනිත් එක අපේ හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කිව්වා විධිමත් භාවයක්මේ කමිටුව වල තිබුනා නං එනව කියල මෙතුමා අවුරුදු පහක් අපිත් එක්ක මේ කමිටුවල මීට කලින් හිටිය නමුත් ඊට ප්‍රථම මේ ගැන කිව්වේ නෑ දැන් තමා කතාව කියන්නේ.  බොහොම ස්තූතියි.

<u>ගරු නගරාධිපතිතුමා.</u>

මම අපේ කොමසාරිස්තුමා සභාවේ අද ඉන්නවා මම එතුමාට කියනවා ඉතාමත් ඉක්මණින් ම පොලිසිය සමඟ ආරක්ෂක අංශ සමග නගරයේ ආරක්ෂාව සම්බන්ධයෙන් නාගරික මන්ත්‍රීවරුන් සියලු දෙනාමත් එක්ක වෙළඳසංගමයත් එක්ක සාකච්ඡාවක් තියලා ඒ සඳහා අවශ්‍ය පියවර ගන්න කටයුතු කරන්න කියලා.

<u>ගරු නාගරික මන්ත්‍රී ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා.</u>

ගරු නගරාධිපති තුමනි ඉදිරියට එන්නේ වැහි කාලේ ඊට ප්‍රථම මේ market පෙදෙස අතුරු මාර්ග පිළිසකර කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒවගේම යාපනය හන්දිය මේ වෙනකොට ජනාකීර්ණ ප්‍රදේශයක් බවට පත් වෙලා තියෙනවා. නමුත් පහසුකම් නැහැ. මම යෝජනා කරනවා අවධානය යොමු කරලා පොදු වැසිකිළි පද්ධතියක් ඒ ප්‍රදේශය ආසන්නයේ සුදුසු තැනක සකස් කරලා දෙන්න කියලා.

- ❖ මේසම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී සුපිනි සඳමාලි මැතිතුමිය විසින් 2019 වර්ෂයසඳහා වන අය වැය යෝජනා වලට අදාල ස්ථානයන් සමගම ඒ අවශ්‍ය කටයුතු ඉටු කිරීමටයෝජනාවක් ඉදිරිපත් කර ඇති බව සභාවට දන්වා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා.</u>

අනිත් එකතමයි ගරු නගරාධිපතිතුමා කඩ 50 ප්‍රදේශය කියන්නෙත් ජනාකීර්ණ ස්ථානයක් වෙළඳ ව්‍යාපාර තියෙන.වා ඊට අමතරව

රැස්වීම් භූමියක් තියෙනවා. පොදු වැසිකිලියක් නැතිකම ගැටලු සහගත තත්ත්වයක් වෙලා තියෙනවා. එනිසා ඒ ප්‍රදේශයේ සුදුසු ස්ථානයකවැසිකිලියක් සකස් කිරීමට කටයුතු කරමු කියලා මම යෝජනා කරනවා. ඒ වගේම පහුගියසැසිවාර වල අපි යෝජනා ඉදිරිපත් කරා යෝජනා තාම ඉටු වෙලා නෑ කියන කාරණේ මම සභාවට ඉදිරිපත් කරනවා. ඒ වගේම සමාජ සංවර්ධන පදනමට මූල්‍ය ආධාරයක් ඉල්ලලා යෝජනාවක් දැම්මා ඒවා තාම ඉටුවෙලා නෑ ගරු නගරාධිපතිතුමා.

තව කරුණක් තමයි ගරු නගරාධිපති තුමනි මේ මුදල් කාරක සභාවට ලැබෙන යෝජනා පිළිබඳව නැවත කමිටුවේ සාකච්ඡා කරලා මහා සභාවේ දී කරුණු ඉදිරිපත් කිරීම සම්බන්ධව. ඒ පිළිබඳව අතිරේක න්‍යායපත්‍රයට එන යෝජනා සම්බන්ධයෙනුත් අපි කරුණු සොයා බලපු නිසා තමා පසුගිය සභාවකදී අපි අර ඉදිරිපත් කළේ ග්‍රාම නිලධාරි වාර්තා ලබාගෙන ඒ ස්ථාන වලනොමැති පුද්ගලයන් සම්බන්ධව. මුදල් කමිටුවට හිටියයි කියලා මේ සභාවට ගෙන යෝජනා ගැන ප්‍රශ්න කරන්න අපටත් අයිතියක් තියෙනවා ඒ අයිතිය නැති කරන්න බැහැ බොහොමස්තුතියි.

<u>ගරු නාගරික මන්ත්‍රී එල් ජී ප්‍රේමචන්ද්‍ර මැතිතුමා.</u>

ගරු නගරාධිපති තුමනි.. යාපනය හන්දියට පොදු වැසිකිලියක් ලබාදීම පිළිබඳව මෙතුමා කතාකරා ඒ පිළිබඳව මම කියන්නේ නගර සභාවෙන් පවත්වා ගෙන යන ලද පොදු වැසිකිළිය ලබාදීම සුදුසුයි කියලා ප්‍රකාශ කර සිටිනවා. අනිත් එක තමයි වතුර සම්බන්ධයෙන් නුවර වැවේ වතුර බොන්න බැරි තත්වයක් උදා වෙලා තියෙනවා තනිකර ක්ලෝරීන් විතරයි එන්නේ . ඒ නිසා ඒ පිළිබඳව යම්කිසි පියවරක් ගැනීමට ඒ කටයුතු කළ හැකි නම්.................. ඉදිරියට වැසි කාලයක් තිබුණත් ජලය පාවිච්චි කරන්න බැරි තත්ත්වයක් තියෙන්නේ සම්බන්ධ සැලකිල්ලක් දක්වලා..........

පදික වෙළඳසැල ගැන කතා කරා. ගරු නගරාධිපති තුමනි යාපනේ හන්දියට ඉන්න පදික වෙළෙන්දන් ඉවත් කරා නගර සභාවෙන් ඉවත් කරන එක නතර කරා දැන් ආර්.ඩී. එකෙන් ඒ ඉවත් කිරීම් සිදු කරනවා. නමුත් එහෙම කරන්නේ ඒ ප්‍රදේශයේ විතරද නැත්නම් අනිත් ප්‍රදේශ වලත් කරනවද ?

<u>ගරු නගරාධිපතිතුමා</u>

මන්ත්‍රීතුමා market එකයි යාපනය හන්දිය අතර ලොකු වාහන ට්‍රැෆික් එකක් තියෙනවා. මේ පදික වෙළඳසැල් ඔක්කොම තියෙන්නෙ පාරේ. ඒ නිසා වාහන නවත්තන කොට traffic එක වැඩි. ඒක නිසා තමයි අපි කිව්වේ දැන් මේක ඇතුලට වෙන්න හදා ගන්න කියලා දැක්කද රේල් පාර පැත්තට දැන් ඇතුලට වෙන්න හදාගෙන ඒ ගොල්ලෝ ඒවා හදලා තියෙනවා.

<u>ගරු නාගරික මන්ත්‍රී එල්.ජී. ප්‍රේමචන්ද්‍ර මැතිතුමා.</u>

නගරාධිපතිතුමනි දැන් ඔය පදික වෙළඳසැල් පවත්වාගෙන යන්න වෙළඳකුටි බෙදා දීමක් වෙනවා අපේ මේ ගරු ජනාධිපතිතුමාගේ, හැරිසන් මැතිතුමාගේ මේ ෆොටෝ ගහපුවා. ඒවා ඉවත්කිරීමක් සිද්ධ වෙනවද ඒව තියන්න දෙනවද ගරු නගරාධිපති තුමනි.

<u>ගරු නගරාධිපතිතුමා.</u>

නැහැ ඒවා ඉවත් කරනවා ඒවා තියන්න කලින් අනුමැතියක් නගර සභාවේ ලබාගත යුතුයි.

<u>ගරු නාගරික මන්ත්‍රී එල් ජී. ප්‍රේමචන්ද්‍ර මැතිතුමා.</u>

ගරු නගරාධිපතිතුමනි, අපි හැමදාම කතා කරනවා පදික වෙළඳසැල් ඉවත් කිරීම සම්බන්ධව.එතකොට නගර සභාවේ දේපල ගැන කතා කරද්දී සභාවේ දේපල ගොඩක් අන්සතු වෙලාතියෙන්නේ. අනිවාර්යෙන්ම මේ නගර සභාව සතු දේපළ නගර සභාව සතු කරගන්න කටයුතුකරන්න. එ්ක යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරනවා. එතකොට පළාත් සභාවට ගිහිල්ලාතියෙන දේවල් ඒ වගේ විවිධ තැන්වලට බෙදිලා ගිහිල්ලා තියෙන දේපළ නගර සභාවේ ආදායම් වැඩිකර ගන්න ඒවා නගර සභාවට නැවත පවරගෙන කටයුතු කරමු කියලයි මා යෝජනා කර සිටිනවා.

ඒ වගේම ගරු නගරාධිපතිතුමා ටියුෂන් පන්ති පිලිබඳවත් දැඩි අවධානය යොමු කරන්න. මොකද ටියුෂන් පන්තිවලින් අද නගරය සම්පූර්ණයෙන්ම පිරිලා ගිහිල්ලා තියෙනවා. නමුත් මේ එහි දරුවන්ට ඉගෙන ගැනීමට තරම් සුදුසු වාතාශ්‍රයක් නෑ ප්‍රමිතියක් නෑ එනිසා මේ සම්බන්ධව දැඩි අවධානය යොමු කරලා අනිත් එක මේසම්බන්ධව ආදායමක් ලැබෙන්න නගර සභාවට ඒ පිළිබඳව දැඩි අවධානයයොමු කරලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කතාව අවසන් කරනවා. බොහොමස්තුතියි.

**ගරු නාගරික මන්ත්‍රී නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මැතිතුමා.**

ගරු නගරාධිපතිතුමනි, තවත් කාරණයක් තියෙනවා කියන්න ළිං සුද්ද කිරීමසම්බන්ධව. ආපදා කලමනාකරන අමාත්‍යාංශයෙන් පොදු ළිං සහ වගා ළිං සුද්ද කිරීමේව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා ඔබතුමා ඒ මේ නගරේ තියෙන පොදු ළිං සියල්ලප්‍රාදේශී ලේකම් තුමා හරහා වාර්තා කරලා ඒ අවශ්‍ය කටයුතු කරන්න හැකියාවතියෙනවා කරමින් ප්‍රකාශ කර සිටිනවා.

**ගරු නගරාධිපතිතුමා.**

අපට වතුර පොම්ප ටිකක් ලබා දෙන්න ගරු මන්ත්‍රිතුමා.

කරුණු ඉදිරිපත් කළ සියලු මන්ත්‍රීවරුන්ට සභාවට සහභාගී වූ සියලු දෙනාට ස්තුතිය ප්‍රකාශ කරමින් ගරු නගරාධිපතිතුමා විසින් මෙදිස සභාවේ කටයුතු ප.ව. 01.55 ට අවසන් කරන ලදී.

ඩබ්.එම්.එස්.එල්. විජේසිංහ,

නියෝජ්‍ය නාගරික කොමසාරිස්,

මහා නගර සභාව,

අනුරාධපුරය.